# The SIGNALLER

## SRI LANKA SIGNAL CORPS JOURNAL - 2023





මේජර් ජෙනරාල් කේඑඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයූ ජ්‍යෙෂ්ඨ නිලධාරී 2023 මාර්තු මස 04 වන දින සුබ මොහොතින් සංඥා බළකාධිපති වශයෙන් රාජකාරී ආරම්භ කරන ලදී

*The*
# SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2023

## කතුවැකිය




ශ්‍රී ලංකා සංඥා බළකායට වසර 80 ක් සපිරෙන මේ අවස්ථාවේ වාර්ෂිකව පලකරනු ලබන "ද සිග්නලර්" **"The Signaller"** සඟරාවේ ප්‍රධාන සංස්කාරක වශයෙන් කටයුතු කිරීමට ලැබීම මා ලද භාග්‍යක් කොට සලකමි.

1998 වර්ෂයේ ආරම්භ වී වසර විසිපහක කාලයක් පුරාවට මෙම සඟරාව ක්‍රමිකව විකාශනය වෙමින් පැමිණ වර්තමානය වන විට ශ්‍රී ලංකා යුද්ධ හමුදා තොරතුරු සන්නිවේදනයේ පෙරගමන්කරු වන ශ්‍රී ලංකා සංඥා බළකායේ සෑම වසරක් පුරා සිදුවුවා වු කාලීන සිදුවීම්, ලද ජයග්‍රහනයන් සහ විශේෂ පුවත් පිළිබද සෑම සාමාජිකයෙකුටම දැන ගැනීමට ලක්කෙරෙන ප්‍රධානතම මෙවලම බවටද මෙම සඟරාව පත්ව ඇත්තේ තාක්ෂණික හා නිර්මාණශීලි හැකියාවන් විදහා දක්වනු පිණිස සැමට අවස්ථාවක්ද ලබා දෙමිනි.

මෙම සඟරාව හරවත් අයුරින් සහ නිර්මාණශීලීව සිත්ගන්නාසුළු අයුරින් සකස් කර මුද්‍රණය කිරීම සඳහා මග පෙන්වු සංඥා බළකාධිපතිතුමා, සංඥා මධ්‍යස්ථාන සේනාවිධායකතුමා ඇතුළු සියළුම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ මෙම සඟරාව සංස්කරණය කිරීම සදහා මා සමග දායක වු සංස්කාරක මණ්ඩලයේ සියළුම සාමාජිකයන්ටත් කාලෝචිත, නිර්මාණශීලී අදහස් හා නිර්මාණයන්ගෙන් දායක වූ සැමටත් ප්‍රධාන කර්තෘ වශයෙන් මාගේ කෘතඥතාපූර්වක ස්තුතිය පුද කරනු කැමැත්තෙමි.

**එම්ජ්කේ ජයවර්ධන පීඑස්සී**
**කර්නල්**
**ප්‍රධාන සංස්කාරක**

## පෙලගැස්ම

| | |
|---|---|
| 01 | ප්‍රධාන සංඥා නිලධාරි සහ සංඥා බළකාධිපතිගේ පණිවුඩය |
| 02 | සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායකගේ පණිවුඩය |
| 03 | මතක පොතින් |
| 48 | විශ්‍රාම ගැනීම් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් |
| 49 | සංඥා බළකායේ විශේෂ අවස්ථාවන් |
| 51 | සංඥා ක්ෂිතිජයෙන් ඔබ්බට |
| 53 | උසස්වීම් |
| 54 | පාඨමාලා |
| 58 | කෙළිබිම ජයගත්තෝ |
| 67 | මන්දාකිණි |
| 70 | කැටපත් පවුර |
| 71 | උපන්දින සුබපැතුම් |
| 72 | මංගල සීනු |
| 73 | ගෞරවණීය උපහාර |
| 80 | සංවේගයෙන් සිහිපත් කරමි |





මේජර් ජෙනරාල් කේඑඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු ජ්‍යෂ්ඨ නිලධාරී වෙත 2023 මාර්තු මස 04 වන දින නව 16 වන සංඥා බළකාධිපති වශයෙන් පිරිනමන ලද සම්මාන පෙළපාලිය



සංඥා බළකාධිපති වෙත පිරිනමන ලද සම්මාන පෙළපාලිය



# ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපතිගේ පණිවුඩය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ සන්නිවේදනයේ පෙරගමන්කරු ලෙස වසර 80 ක අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා සංඥා බළකායේ 16 වන බළකාධිපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරී වශයෙන් **“The Signaller”** සඟරාවේ 25 වන කලාපය වෙනුවෙන් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද ඉමහත් ගෞරවයක් ලෙස සලකමි.

ගෝලීය වශයෙන් නිරන්තර යාවත්කාලීන වන නවීන තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කරමින් යුද්ධ හමුදාවේ කාලීන අවශ්‍යතාවයන්ට අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, විද්‍යුත් සංග්‍රාමික ක්‍රියාන්විතයන්, සයිබර් ආරක්ෂාව සහ කෘතිම බුද්ධිය ඇතුළු නව තාක්ෂණික ක්‍රමවේදයන් තුලින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට හා අප මාතෘභූමියට අද්විතීය මෙහෙවරක් ඉටු කරලීම අප බළකායේ ඒකායන අරමුණ වනු ලැබේ. නූතන සන්නිවේදන හා තොරතුරු තාක්ෂණය යද්ධ හමුදාව තුළ අත්‍යවශ්‍ය අංගයක් බවට පත්වෙමින් ඇති කාල වකවානුවක එම ක්‍රමවේදයන්ට අනුගතවෙමින් නිවැරදිව, වේගවත්ව හා ආරක්ෂිතව කටයුතු කිරීම අප බළකායේ ප්‍රධානතම කාර්යභාරය බැව් පෙන්වා දෙමි.

එමෙන්ම සංඥා බළකාය වෙත පවරනු ලබන රාජකාරීන් නොපිරිහෙළා ඉටු කිරීම සඳහා බළකායේ සියලුම සාමාජිකයින් දැනුමෙන් සන්නද්ධ කරමින් නවීන සන්නිවේදන හා තොරතුරු තාක්ෂණය, සයිබර් ආරක්ෂණය හා විද්‍යුත් සංග්‍රාම පිළිබඳ දැනුම පුළුල් කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික හැකියාව ලබාදීමටත් ඇවැසි ක්‍රියාමාර්ග යන්ද මේ වන විට ආරම්භ කර ඇත. සංඥා බළකාය ප්‍රතිසංවිධානය කරමින් 2 වන සංඥා බලසේනාව නුදුරේදී ආරම්භ කිරීමට කටයුතු කර ඇති අතර, 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය නව විද්‍යුත් සංග්‍රාමික ඒකකයක් බවට පරිවර්තනය කිරීමටත් ඇවැසි කටයුතු කඩිනමින් ඉටු කරමින් පවතී.

සංඥා බළකායෙහි ක්‍රීඩක ක්‍රීඩිකාවන් විසින් දක්වන ලද දක්‍ෂතාවයන් හේතුවෙන් බළකායෙහි අභිමානය ඉහළ තලයකට ගෙන ඒමට හැකිවී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වසර 32 ට පසු මෙම වසරේ අන්තර් රෙජිමේන්තු රගර් තරඟාවලියේ ශූරයන් වීමට අප බළකායට හැකිවිය. සංඥා බළකා සෙබළ සෙබලියන්ගේ සුභසාධන කටයුතු නගා සිටුවීම සඳහා ව්‍යාපෘති කිහිපයක්ද මේවන විට ආරම්භ කර ඇති අතර, එම සුභසාධන කාර්යයන්ද ඉදිරියේදී තවදුරටත් පුළුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව සතුටින් යුතුව දන්වා සිටිමි.

තිස් වසරක කුරිරු යුධමය කාල වකවානුව තුළ සන්නිවේදනයේ පෙරගමන්කරු වූ අප බළකායේ අරමුණු ඉටුකරදීම සඳහා ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ප්‍රාණ දානය දුන් සියලු නිලධාරීන් සහ සෙසුනිලයින්ටත්, සටනේ දී රණකෂිතයට පත් සියලුම නිලධාරීන් සහ සෙසුනිලයින්ටත්, සංඥා බළකායට අවේණික රාජකාරී පමණක් නොව ක්‍රීඩාව තුලින් දෙස්/විදෙස් ක්‍රීඩක ක්‍රීඩිකාවන් අභිබවා යමින් ජයග්‍රහන රැසක් අත්කරදුන් අප බළකායට මෙන්ම සමස්ථ යුද්ධ හමුදාවට හා මාතෘභූමියට ඉමහත් කීර්තියක් ලබාදුන් සංඥා බළකා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ටද මාගේ ගෞරවය හා ආචාරය මෙහිදී පුදකර සිටිමි.

අවසාන වශයෙන් සංඥා බළකායේ කාලීන සිදුවීම් පිළිබඳව අප සාමාජිකයන් දැනුවත් කිරීම හා නිර්මාණශීලී හැකියාවන් ඇති අයවලුන්ගේ කුසලතාවයන් වැඩිදියුණු කිරීමේ තෝතැන්නක් බඳු වූ මෙම **“The Signaller”** සඟරාවේ කර්තෘ මණ්ඩලයට මාගේ හද පිරි කෘතඥතාවය පලකර සිටින අතර, සංඥා බළකායේ සියලුම නිලධාරීන්, සෙසුනිලයන්, සිවිල් සේවක කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ටත් සාමය සතුට සපිරි සෞභාග්‍යමත් අනාගතයක් උදාවේවායි ප්‍රාර්ථනා කරමි.

**කේඑඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු**
**මේජර් ජෙනරාල්**
**ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති**

# සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායකගේ පණිවුඩය



80 වසරක ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා සංඥා බළකායේ අභිමානය පිළිබිඹු කරමින් තාක්ෂණික, කාලීන සිදුවීම් පිළිබඳ සංඥා රෙජිමේන්තු සාමාජිකයන් දැනුවත් කිරීම සහ නිර්මාණශීලි හැකියාවන් ඇති අයවළුන්ගේ කුසලතාවන් වැඩි දියුණු කිරීමේ මහඟු කාර්යයට උරදෙමින් සන්නිවේදන තාක්ෂණයේ නව මං පෙත් පුළුල් කරමින් ගෝලීය සන්නිවේදන ක්‍රමෝපායන් සමඟ ගැටෙමින් සමස්ථ යුද්ධ හමුදාවේ සංනිවේදන අවශ්‍යතාවයන්හි අභිවෘද්ධිය උදෙසා කැපවීමෙන් කටයුතු කරන සංඥා බළකායේ නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ නිර්මාණශීලී හැකියාවන් මෙන්ම කුසලතාවයන් වැඩිදියුණු කිරීමේ මහඟු කාර්යයට උරදී කටයුතු කරන **“The Signaller”** සඟරාවේ 25 වන කලාපය එළිදක්වන මේ අවස්ථාවේ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් පණිවුඩයක් ගෙන ඒමට ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකමි.

**“The Signaller”** සඟරාව තුලින් සංඥා බළකාය පුරා 30 වසරක යුධ සමයේ ලද අත්දැකීම් සමුදාය අනාගත පරපුර වෙත බෙදා ගැනීමටත්, සන්නිවේදන තාක්ෂණික දැනුම බෙදා ගැනීමටත්, ඔවුන්ගේ නිර්මාණශීලි අදහස් එළි දැක්වීමටත් හැකියාව ලැබෙන බව නොරහසකි. සංඥා සෙබල සෙබලියන් විසින් මෙම වසර තුල විෂයානුබද්ධව සහ ක්‍රීඩාව තුලින් අත්පත් කර ගන්නා ලද ජයග්‍රහන එළි දැක්වීමට මහඟු තෝතැන්නක් වන **“The Signaller”** සඟරාව අඛණ්ඩව 25 වන වරටත් ඉදිරිපත් කිරීමට හැකිවීම සමස්ථ සංඥා බළකායේ සියළු සාමාජිකයින් වන අප විසින් ලද විශිෂ්ඨ ජයග්‍රහණයක් බව සඳහන් කිරීමට කැමැත්තෙමි.

නව නිර්මාණ, අදහස් හා වැදගත් තොරතුරු ලබාදුන් සංඥා බළකායේ සියළු සාමාජික සාමාජිකාවන්ට සහ සංඥා බළකාය තුල පසුගිය වසරේ ගමන් මග නිර්මාණශීලීව ගුණාත්මක භාවයෙන් යුක්තව එළි දැක්වීම සඳහා ඇප කැපවී කටයුතු කල මෙම සඟරාවේ සංස්කාරක මණ්ඩල සාමාජිකයින්ට මාගේ කෘතඥතාවය පුදකරන අතර, සංඥා බළකා සියළු සාමාජිකයින්ටත්, ඔවුන්ගේ පවුල්වල සියළු දෙනාටත් සුභ අනාගතයක් වේවායි ප්‍රාර්ථනා කරමි.

**ඒකේඩී අධිකාරි යූඑස්පී**
**බ්‍රිගේඩියර්**
**රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක**

# මතක පොතින්

## ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය

සමස්ථ යුද්ධ හමුදාවේ සන්නිවේදන සහ තොරතුරු තාක්‍ෂණ අවශ්‍යතා සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඒ සබැඳි සමස්ථ වගකීම් ක්‍රියාත්මක කිරීමේ අරමුණ පෙරදැරිව 2007 මාර්තු මස 12 වන දින ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය ලෙස මෙම කාර්යාලය පනාගොඩ යුද්ධ හමුදා ජනපදය තුල ස්ථාපනය කරන ලදි. අනතුරුව නව යුද්ධ හමුදා මූලස්ථාන සංකීර්ණය තුල ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය 2019 නොවැම්බර් මස 29 වන දින අභිනවයෙන් ස්ථාන ගතවන ලදි. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ විකාශනය හා අනාගත වෙනස්කම්වලට උචිත වන පරිදි 2020 ජූලි මස 20 වන දින සිට ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය, ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය වශයෙන් ප්‍රතිස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල අණ, පාලනය සහ පරිපාලනය සඳහා අවශ්‍ය වන සන්නිවේදන, පරිගණක තොරතුරු තාක්‍ෂණ, විද්‍යුත් සංග්‍රාමික සහ සයිබර් ආරක්‍ෂණ යන ක්‍ෂේත්‍රයන් ආවරණය වන පරිදි පහසුකම් සැපයීම ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලයේ ප්‍රධාන වගකිම වේ. ඒ අනුව යුද්ධ හමුදාවේ සන්නිවේදන, තොරතුරු තාක්‍ෂණය හා සයිබර් ආරක්‍ෂණ කටයුතු සම්බන්ධයෙන් වූ සමස්ථ වගකීම ප්‍රධාන සංඥා නිලධාරී විසින් කරනු ලබන අතර, එම සමස්ථ ක්‍රියාවලින් සබැඳි උපදෙස් යුද්ධ හමුදාධිපති වෙත සැපයීමේ වගකීමද ප්‍රධාන සංඥා නිලධාරී විසින් දරණු ලබයි.

ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය ආරම්භයේ සිට මේ දක්වා ප්‍රධාන සංඥා නිලධාරීන් දස දෙනෙකු යටතේ සමස්ථ යුද්ධ හමුදාවට හා සන්නිවේදන ක්‍ෂේත්‍රයේ රාජ්‍යය ආයතනයන්හි අවශ්‍යතා ඉටු කිරීම වෙනුවෙන් මහගු හා අද්විතීය සේවාවක් ඉටු කර ඇත. 2022 ජූනි මස 03 වන දින සිට 2023 මාර්තු මස 01 වන දින දක්වා ප්‍රධාන සංඥා නිලධාරී වශයෙන් මේජර් ජෙනරාල් එච්එම්එල්ඩී හේරත් ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී රාජකාරි ඉටු කරනු ලැබූ අතර, තත් ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම යාමෙන් අනතුරුව මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී ප්‍රධාන සංඥා නිලධාරී වශයෙන් 2023 මාර්තු මස 01 වන දින සිය ධූරයේ රාජකාරි ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ඉදිරි දැක්මට අනුව ක්‍රියාත්මක කර ඇති යුද්ධ හමුදා මූලෝපායික සැලැස්ම 2020 - 2025 **(SLAWFS)** අනුව අනුගත වෙමින් යුද්ධ හමුදා සන්නිවේදන, තොරතුරු තාක්‍ෂණ, විද්‍යුත් සංග්‍රාමික හා සයිබර් ආරක්‍ෂණ අවශ්‍යතාවයන් නිසි පරිදි සම්පාදනය කරමින් වර්ථමාන හා අනාගත අභියෝගයන් හමුවේ යුද්ධ හමුදා කාර්යභාරයන් නිසි පරිදි ඉටුකරලීමේ කාර්යභාරයට මෙම කාර්යාලය සිය මහගු දායකත්වයක් ලබාදෙමින් කටයුතු කරනු ලබයි.



මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු
ප්‍රධාන සංඥා නිලධාරී

රටතුල ශීඝ්‍රයෙන් ව්‍යාප්තවූ කොරෝනා වසංගත තත්වය හමුවේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නායකත්වයෙන් ක්‍රියාත්මක කරන ලද සමස්ථ වැඩ පිළිවෙල තුල මෙන්ම ජාතික එන්නත්කරණ වැඩපිළිවෙල සඳහාද මෙම කාර්යාල මූලිකත්වය යටතේ ප්‍රශංසනීය කාර්යභාරයක් ඉටුකරලීමට හැකිවිය. වර්ථමානයේ ඇතිවී ඇති ආර්ථික අභියෝග හමුවේ සීමිත මූල්‍ය සම්පත් මනා ලෙස කළමණාකරණය කරමින් යුද්ධ හමුදාවේ සන්නිවේදන, තොරතුරු තාක්‍ෂණ, විද්‍යුත් සංග්‍රාමික හා සයිබර් ආරක්‍ෂණ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා සිය දායකත්වය නොපිරිහෙලා ලබාදෙමින් මෙම කාර්යාලය ක්‍රියාකරනු ලබයි. මෙම ක්‍රියාවලිය තුල කටයුතු කිරීමේදී ගතවූ වර්ෂය තුල ජයග්‍රහණ රාශියක් හා සුවිශේෂ කඩඉම් රාශියක් පසුකිරීමට අවස්ථාව උදාවිය.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුලින් අමතර කොටස් ආනයනය කොට 10 ශ්‍රීලංසංඥ මූලිකත්වයෙන් **“Flash Com”** නමින් නවීන **VHF** හා **UHF** වර්ගයේ ගුවන් විදුලි යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීම, විශේෂ ආරක්‍ෂක කටයුතු සඳහා යෝග්‍ය වන පරිදි හා හදිසි අවස්ථාවන්හිදී භාවිතා කිරීම සඳහා යෝග්‍ය වන පරිදි ගුවන් විදුලි යන්ත්‍රයක් **PRM 4515 COUGAR** ගුවන් විදුලි යන්ත්‍ර යොදා ගනිමින් නවතමයෙන් නිෂ්පාදනය කිරීම සඳහා මූලිකත්වය ගෙන ක්‍රියාකිරීම පර්යේෂණ හා සංවර්ධන ක්‍ෂේත්‍රයේ අප ලැබූ ජයග්‍රහණයන් වේ.

චීන සමූහාණ්ඩුව හා ශ්‍රී ලංකා ජන රජය අතර අත්සන් කරන ලද ආරක්ෂක සහයෝගීතා ගිවිසුම් වලට අදාලව ලබාදීමට නියමිතව තිබූ ගුවන් විදුලි යන්ත්‍ර හා අති නවීන සන්නිවේදන පද්ධතීන් කඩිනමින් ලබාගැනීම සඳහා මෙම කාර්යාලය සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියාකරනු ලැබූ අතර, එම සුවිශේෂී ප්‍රධානයේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා සංඥා බළකාය වෙත **Hand Held** ගුවන් විදුලි යන්ත්‍ර 2000 ක්, **Mobile Base Station** ගුවන් විදුලි යන්ත්‍ර 550 ක් හා **Repeater** ගුවන් විදුලි යන්ත්‍ර 100 කින් සමන්විත අති විශාල ගුවන් විදුලි උපකරණ තොගයක් ලබා ගැනීමට හැකිවූ අතර, අවශ්‍ය පුහුණු කටයුතු එම ගුවන් විදුලි යන්ත්‍ර නිෂ්පාදිත **Hytera Communications Corporation** ආයතනය මගින් ලබා ගැනීමටද කටයුතු කරන ලදි. මෙම ගුවන් විදුලි යන්ත්‍ර යොදා ගනිමින් 1 වන බළකාය ආසේමු (නැගෙනහිර), ආසේමු (බටහිර), ආසේමු (මධ්‍යම), කමාන්ඩෝ හා විශේෂ බළකායේ සමස්ථ ගුවන් විදුලි සංනිවේදන අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට ක්‍රියා කර ඇති අතර යුද්ධ හමුදාධිපති ගුවන් විදුලි ජාලය බලසේනා මට්ටම දක්වා ව්‍යාප්ත කරවීමටද මෙම ගුවන් විදුලි යන්ත්‍ර යොදා ගනිමින් ක්‍රියා කර ඇත.

මෙම චීන සමූහාණ්ඩු ප්‍රධානයට සමගාමීව ශ්‍රී ලංකා පොලීසිය වෙත ලබාදීමට නියමිතව තිබූ **UHF Tetra** ගුවන් විදුලි සංනිවේදන පද්ධතිය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ලබා ගැනීම සඳහා මෙම කාර්යාලය සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියා කරන ලද අතර, අති නවීන සන්නිවේදන පහසුකම් රාශියකින් සමන්විත මෙම පද්ධතිය යොදා ගනිමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ගුවන් විදුලි සන්නිවේදන තාක්ෂණය නව මානයන් කරා රැගෙන යාමට අවැසි කටයුතු මෙම කාර්යාලය මගින් සිදු කරමින් පවතී. තවද චීන සමූහාණ්ඩුවේ ප්‍රධානයක් වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ලබාදෙන ලද අති නවීන හදිසි සංනිවේදන රථ 11 ක් නොබෝදා ශ්‍රී ලංකා සංඥා බළකාය වෙත නිල වශයෙන් භාරදීම සිදුවූ අතර, මෙම සන්නිවේදන රථ සතු තාක්ෂණික පහසුකම් හා හැකියාවන් තවදුරටත් වර්ධනය කරමින් එම රථ විද්‍යුත් සංග්‍රාමික කාර්යයන් ඉටුකල හැකි පරිදි නවීකරණය කොට නවතමයෙන් ස්ථාපිත කිරීමට නියමිත 9 ශ්‍රීලංසංබ (විද්‍යුත් සංග්‍රාමික) ඒකකය යටතේ යුද්ධ හමුදාවේ විද්‍යුත් සංග්‍රාමික ශක්තිය වැඩිදියුණු කිරීමට මෙම කාර්යාලය වෙතින් සැලසුම් සම්පාදනය කොට ඇත.

වර්තමාන යුද්ධ හමුදාව ප්‍රතිව්‍යුහගත කිරීම් අනුව යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් හා ප්‍රධාන සංඥා නිලධාරිගේ මගපෙන්වීම මත යුද්ධ හමුදා මූලස්ථානයේ තොරතුරු තාක්ෂණ පද්ධති භාරගැනීම හා නඩත්තු කිරීමේ කටයුතු සිදුකිරීම වෙනුවෙන් ආසේමු (යා) බළ ප්‍රදේශයේ රාජකාරි නියැලි සිට 6 ශ්‍රීලංසංබ ඒකකය යුද්ධ හමුදා මූලස්ථානයේ තොරතුරු තාක්ෂණ ඒකකයක් ලෙස ස්ථාන ගතවීමට කටයුතු කරන ලදී. තවද, 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය විද්‍යුත් සංග්‍රාමික බළඇණියක් ලෙස නුදුරේදී ස්ථාපිත කිරීම සඳහා මෙම කාර්යාල උපදෙස් හා මගපෙන්වීම් මත සිදු කරගෙන යනු ලබයි.

ශ්‍රී ලංකා සංඥා බළකාය වෙතින් **'Precise Human Technology Symmetry for Better Organizational Efficacy'** යන මැයෙන් පැවැත්වීමට නියමිත 'තාක්ෂණික සම්මන්ත්‍රණ' මාලාවේ ප්‍රථම සම්මන්ත්‍රණය යුද්ධ හමුදාධිපතිගේ ප්‍රධානත්වයෙන් 2023.02.22 දින යුද්ධ හමුදා මූලස්ථාන බහුකාර්ය සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වනු ලැබූ අතර, එම සම්මන්ත්‍රණය සඳහා දිවයින පුරා රාජකාරියෙහි නියුතු යුද්ධ හමුදා නිලධාරීන් 160 කට අධික පිරිසක් මාර්ගගත තාක්ෂණය ඔස්සේ සහභාගී වී ඇත.

රණවිරු තොරතුරු තාක්ෂණ ආයතනයන් ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාල අධීක්ෂණය යටතේ සාර්ථකව පවත්වාගෙන යනු ලබන අතර, රණවිරුවන්ගේ මෙන්ම ඔවුන්ගේ දූ දරුවන්ගේ සුභසාධනය මුලිකත්වය කර ගනිමින් සහනදායි ගාස්තු යටතේ පාඨමාලාවන් පැවැත්වීම සිදුකරනු ලබයි. ආරක්ෂක මුලස්ථාන ආවරණය කර ගනිමින් ආරම්භ කරන ලද රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතන 07 ක් දැනට ක්‍රියාත්මක වන අතර, 2022 වර්ෂයේ සිට මේ දක්වා රණවිරුවන් 493 දෙනෙකුට සහ සිවිල් අයවළුන් 960 දෙනෙකුට තොරතුරු තාක්ෂණ පාඨමාලා හැදෑරීමට අවස්ථා සලසාදී ඇත. ඉහත සඳහන් රාජකාරීන් ඉටුකිරීම සඳහා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක මණ්ඩලය සහ සංඥා බලසේනා මූලස්ථානය වෙතින් ලබාදුන් සහයෝගය ඉතා වැදගත් වේ.



මේජර් ජෙනරාල් කේඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී 2023 මාර්තු මස 01 වන දින ප්‍රධාන සංඥා නිලධාරී තනතුරෙහි වැඩ භාරගැනීම

# චීන සමුහාණ්ඩුව විසින් ප්‍රදානය කරන ලද විශේෂ හදිසි සන්නිවේදන පද්ධතියට අයත් ජංගම සන්නිවේදන රථ නිල වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත භාරදීම









චීන සමුහාණ්ඩුව විසින් ප්‍රදානය කරන ලද විශේෂ හදිසි සන්නිවේදන පද්ධතියට අයත් ජංගම සන්නිවේදන රථ 11 ක් 2023 අගෝස්තු මස 22 වන දින යුද්ධ හමුදා මුලස්ථානයේදී ශ්‍රී ලංකා සංඥා බළකාය වෙත නිල වශයෙන් භාරදීම







2023 පෙබරවාරි මස 22 වන දින යුද්ධ හමුදා මූලස්ථාන බහුකාර්ය සම්මන්ත්‍රණ ශාලාවේදී **‘Precise Human - Technology Symmetry for Better Organizational Efficacy’** යන මැයෙන් පවත්වන ලද ‘තාක්ෂණික සම්මන්ත්‍රණ’ මාලාවේ අවසන් දේශණය වර්ථමාන ප්‍රධාන සංඥා නිලධාරි මේජර් ජෙනරාල් කේඑඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු විසින් **Recap and Link to Future - Revolutionary AI Applications re-demarcate Intelligence and Security’** මාතෘකාව ඔස්සේ පවත්වන ලදී





චීන සමුහාණ්ඩුවේ ප්‍රදානයක් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ලබාදෙන ලද **Hytera** ගුවන් විදුලි යන්ත්‍ර සබැඳි පුහුණු වැඩමුළුවේ සමාරම්භක අවස්ථාව සදහා ප්‍රධාන සංඥා නිලධාරි සහභාගීවීම





**PRM 4515 COUGER MAN PACK** ගුවන් විදුලි යන්ත්‍ර 2023 මැයි මස 02 වන දින ප්‍රධාන සංඥා නිලධාරි විසින් 4 විබ අණදෙන නිලධාරි වෙත භාරදීම





රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනය පනාගොඩ සහ මහනුවර වෙතින් ප්‍රායෝගික පුහුණුවීම් සිදුකිරීම



කර්නල් එස්ජේකේඩී ජයවර්ධන යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2023 ජුලි මස 04 වන දින බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ තනතුරෙහි වැඩ භාර ගැනීම



කර්නල් එම්ආර් හමීම් යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2023 ජනවාරි මස 18 වන දින කර්නල් තොරතුරු තාකෂණ තනතුරෙහි වැඩ භාර ගැනීම



ලුතිනන් කර්නල් එච්එම්බීඑම්බී හේරත් යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2023 අප්‍රේල් මස 12 වන දින ප්‍රමානි 1 (සංඥා) තනතුරෙහි වැඩ භාර ගැනීම



ලුතිනන් කර්නල් ඩබ්ලිව්සීඑස් නානායක්කාර ජ්‍යෙෂ්ඨ නිලධාරී 2023 ජුලි මස 02 වන දින ප්‍රමානි 1 (විද්‍යුත් සංග්‍රාමික) තනතුරෙහි වැඩ භාර ගැනීම

# තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය

තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ තොරතුරු තාක්ෂණ අංශයෙහි අභිවෘද්ධිය උදෙසා විශාල මෙහෙයක් ඉටුකරනු ලබන අතර, එය වර්ෂ 2010 මාර්තු මස 01 වන දින ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය යටතේ ආරම්භ කරන ලද අතර දැනට යුද්ධ හමුදා මුලස්ථානය තුල ස්ථානගතව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ තොරතුරු තාක්ෂණ අංශයෙහි අභිවෘද්ධිය උදෙසා විශාල මෙහෙයක් මේ වන විට ඉටුකරනු ලබයි.



බ්‍රිගේඩියර් එච්ඩීජේපී වීරතුංග
අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල මෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ජාතික අවශ්‍යතා සඳහාද අවශ්‍යතාවය පරිදි මෘදුකාංග නිර්මාණය, වෙබ් අඩවි  නිර්මාණය සහ පරිගණක ජාල විසදුම්, සැලසුම් කිරීම, නිපදවීම හා නඩත්තු කිරීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සිදුකරනු ලබයි. තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මෘදුකාංග සංවර්ධන හා ඉංජිනේරු මධ්‍යස්ථානය, දත්ත මධ්‍යස්ථාන, ජාල මෙහෙයුම් මධ්‍යස්ථාන, වෙබ්අඩවි සංවර්ධන සහ පර්යේෂණ හා සංවර්ධන අංශයන්ගෙන් වර්තමාන තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. තොරතුරු තාක්ෂණ ඒකකයන් වන 6 ශ්‍රීලංසංබ හා 11 ශ්‍රීලංසංබ ඒකකයන්ට අමතරව යුද්ධ හමුදාව තුල තොරතුරු තාක්ෂණයේ ව්‍යාප්තිය සමග ඇති වී ඇති සයිබර් තර්ජනයන්ට සාර්ථකව මුහුණ දීම, සයිබර් ආරක්ෂක සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ සයිබර් ආරක්ෂණ ඒකකයක් වශයෙන් 12 වන ශ්‍රී ලංකා සංඥා බළකාය 2017 ජනවාරි මස 25 වන දින ස්ථාපනය කරන ලදී.

තවද 12 වන ශ්‍රී ලංකා සංඥා බළකාය සහ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයට අනියුක්තව රාජකාරී ඉටුකරනු ලබන මෘදුකාංග ඉංජිනේරුවරුන්, ජාලකරණ ඉංජිනේරුවරුන්, තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ විශ්ලේෂකයින් මෘදුකාංග තත්ව පරීක්ෂක ඉංජිනේරුවරුන්, දෘඩාංග ඉංජිනේරුවරුන්, හා තොරතුරු තාක්ෂණ නිලධාරීන් මෙන්ම පරිගණක ක්‍රියාකරුවන් සහ පරිගණක කාර්මිකයින් විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහිම තොරතුරු තාක්ෂණ අංශයේ අභිවෘද්ධිය සඳහා වූ විවිධ ව්‍යාපෘති සහ එම විෂය සම්බන්ධව විවිධ වූ තොරතුරු තාක්ෂණ රාජකාරීන්වල නිරතව සිටින අතර, එම සියළුම ව්‍යාපෘතීන් තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සෘජු අධීක්ෂණය යටතේ ඉටුකරනු ලබයි.





2023 සැප්තැම්බර් මස 06 වන දින තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ 11 වන තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ වශයෙන් කර්නල් එච්ඩීජේපී වීරතුංග ජ්‍යෙෂ්ඨ නිලධාරි සුබ මොහොතින් රාජකාරි ආරම්භ කල අවස්ථාව



තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ දායකත්වයෙන් මානව සම්පත් කළමණාකරන මෘදුකාංගයක් සිවිල් ආරක්ෂක බළකාය වෙත නිල වශයෙන් භාරදීමේ අවස්ථාව



2023 ජුලි මස 04 වන දින තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ කර්නල් තොතා වශයෙන් කර්නල් පීඩබ්ලිව්එම්එම්ඩී විජේරත්න ආර්එස්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිළධාරි රාජකාරීන් ආරම්භ කල අවස්ථාව

# සංඥා බළසේනා මූලස්ථානය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ඇවැසි සන්නිවේදන අවශ්‍යතා නව තාක්ෂණයෙන් යුතුව ඉතා උසස් මට්ටමින් ඉටු කිරීමේ භාරදූර්ය වගකීම සංඥා බළසේනා මූලස්ථානය වෙත පැවරී ඇත.

සංඥා සම්බන්ධතාවය ඉතා උසස් මට්ටමින් පවත්වා ගැනීම සදහා ආරක්ෂක සේනා මූලස්ථාන හා සියළුම පාබල සේනාංක මූලස්ථාන ආවරණය වන පරිදි උසස් තාක්ෂණික ක්‍රමවේදයකට අනුව යුද්ධ හමුදාවේ ඉදිරි ප්‍රගමනය උදෙසා **IP** තාක්ෂණයෙන් යුත් දුරකථන හුවමාරු පද්ධති ඇතුළු නව දුරකථන හුවමාරු පද්ධති ස්ථාපනය කර ඇත. එමෙන්ම ආරක්ෂක සේනා මූලස්ථාන, පාබල සේනාංක මූලස්ථාන, පාබල බළසේනා මූලස්ථාන හා පුහුණු පාසල් සඳහා නව තාක්ෂණික උපාංගයන්ගෙන් යුත් ජන ඇමතුම් උපකරණ කට්ටලයන් ලබාදිමට හැකියාව ලැබී ඇත.





**බ්‍රිගේඩියර් එකේඩී අධිකාරි යූඑස්පී**
**වැඩබලන සංඥා බළසේනාධිපති**

චීන සමූහාණ්ඩු ආධාර යටතේ නවතමයෙන් ශ්‍රීලංකා යුද්ධ හමුදාව වෙත ලද හයිටෙරා ගුවන් විදුලි යන්ත්‍ර සහ සංඥා උපකරණයන් පිලිබද පුහුණු වැඩමුළු හයිටෙරා ආයතනයේ චීන නියෝජිතයින්ගේ ප්‍රධානත්වයෙන් සංඥා ඒකකයන්හි රාජකාරී කරනු ලබන සංඥා සම්බන්ධතා බලඝණාධිපතිවරුන් සහ සෙනින් හටත් ආසේමු/පාසේමු හා පාබසේමු රාජකාරී කරනු ලබන සංඥා අංශ නිලධාරීන් හා සෙනින්ටත් මෙම බසේමු අධීක්ෂණය යටතේ පැවැත්වීමට කටයුතු සිදුකර අදාල ගුවන් විදුලි යන්ත්‍ර භාවිතයෙන් 1 බළකාය හා ආරක්ෂක සේනා මූලස්ථානයන් ආවරණය වන පරිදි සංඥා සම්බන්ධතාවයන් පිහිටුවන ලදී.

එහි ප්‍රායෝගික ක්‍රියාකාරකම් ද 10 ශ්‍රිලංසංබ ඒකකය වෙතින් සිදුකර අදාල ගුවන් විදුලි යන්ත්‍ර සම්බන්ධ පූර්ව දැනුමක් ඔවුන් හට ලබා දිමට කටයුතු කරන ලද අතර, එම ගුවන් විදුලි යන්ත්‍ර භාවිතයෙන් යුද්ධ හමුදාධිපති අණ පරිදි ගුවන් විදුලි ජාලය පාසේමු/පාබසේමු දක්වා ස්ථාපිත කිරීමටද මේ වන විට ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.

නවතමයෙන් ස්ථාපිත කිරීමට නියමිත විද්‍යුත් සංග්‍රමික ඒකකය වෙනුවෙන් චීන සමූහාණ්ඩුව ආධාර යටතේ ලද විද්‍යුත් සංග්‍රාමික ජංගම රථ 11ක් ද දැනට මෙම බසේමු සන්තකයේ ඇති අතර, එම රථයන් මගින් සිදුකරනු ලබන සන්නිවේදන කාර්යයන් පිළිබදව චීන සමූහාණ්ඩුවේ නියෝජිතයින් සමග අප සෙබළුන් පුහුණු කිරීමේ වැඩමුළුවක් නුදුරේදී පැවැත්වීමට කටයුතු සූදානම් කරමින් පවතී.

යුද්ධ හමුදාවේ සන්නිවේදනයේ පෙර ගමන්කරු වන සංඥා බළකාය වෙත පැවරෙන රාජකාරීන් යුධ සමයන්ට වඩා වර්තමානයේ බහුල වී ඇත. මුළු දිවයිනම ආවරණය වන පරිදි දෙස් විදෙස් ප්‍රභූ වරුන් සහභාගී වන ජාතික සහ යුද්ධ හමුදා විශේෂ උත්සව අවස්ථාවන් වෙනුවෙන් ජන ඇමතුම් හා **LED** තිර පද්ධති සේවාව ලබාදීම, දිවයිනම ආවරණය වන පරිදි නව දුරකථන හුවමාරු සවි කිරීම හා සන්නිවේදන හා දත්ත ජාල පුළුල් කිරීම මෙන්ම ගුවන් විදුලි/දුරකථන හුවමාරු ආදී සංඥා උපකරණ අලුත් වැඩියා කටයුතු සිදු කරමින් සංඥා සම්බන්ධතාවයන් වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම හා විදේශීය සංඥා උපකරණ පිළිබඳව ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකිරීම වැනි කාර්යන් සංඥා බළසේනා මූලස්ථානයේ අධීක්ෂණය යටතේ සිදුකරනු ලබයි.

එමෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ ඇති සංඥා උපකරණ සහ තොරතුරු හා සන්නිවේදනය පිළිබදව **VSIS** යන පුද්ගලික ආයතනයේ ඒකාගත්වය මත සියලු නඩත්තු කටයුතු සංඥා බළකාය වෙත පවරා ගැනීමට ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

75 වන නිදහස් දින පෙළපාලිය වෙනුවෙන් සංඥා සම්බන්ධතාවය ලබාදීම සදහා ඇවැසි සංඥා උපකරණ/උපාංග ලබාදෙමින් මෙම බසේමු අධික්ෂණය යටතේ සංඥා ඒකකයන් සමග එක්ව සාර්ථකව නිදහස් දින පෙළපාලිය සිදුකිරීමට හැකියාව ලැබී ඇත.

එලෙස ගෙවී ගිය කාලය තුල සංඥා සම්බන්ධතාවය ලබාදිමේ කාර්ය වැඩිදියුණු කිරීමටත් රාජ්‍ය හා හමුදා විශේෂ උත්සව කටයුතු සඳහා සංඥා සම්බන්ධතාවය ලබාදීමට සංඥා බළසේනාව වශයෙන් අප හට හැකියාව ලැබී ඇත.



25 වන සංඥා බළසේනාධිපති වශයෙන් පත්වූ කර්නල් එච්ඩීජේපී වීරතුංග ජ්‍යෙෂ්ඨ නිලධාරී වැඩ භාර ගැනීමට ප්‍රථම ආගමික වතාවත් සිදු කිරීමේ අවස්ථාව





25 වන සංඥා බළසේනාධිපති වශයෙන් පත්වූ කර්නල් එච්ඩීජේපී වීරතුංග ජ්‍යෙෂ්ඨ නිලධාරී තනතුරෙහි වැඩ භාරගැනීම





සංඥා බළසේනාවේ 35 වන සංවත්සරය වෙනුවෙන් සංඥා බළසේනාධිපති කර්නල් එච්ඩීජේපී වීරතුංග ජ්‍යෙෂ්ඨ නිලධාරී හට රෙම ශ්‍රීලංසංබ සෙබළුන් විසින් පිරිනමන ලද කඳවුරු මුරය



චීන සමූහාණ්ඩුව වෙතින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ප්‍රදානය කරන ලද හයිටෙරා ගුවන් විදුලි යන්ත්‍ර පිළිබද එම නියෝජිතයින් විසින් හදුන්වාදීම




සංඥා බළසේනාධිපති විසින් සංඥා බලසේනාවේ නාමපුවරුව විවෘත කිරීම





සංඥා බළසේනාවේ 35 වන සංවත්සරයට සමගාමීව මහාබෝධි ළමා නිවාසය වෙත දිවා ආහාර වේලක් පිලිගැන්වීම

## ශ්‍රී ලංකා සංඥා බළකා 79 වන සංවත්සරය සැමරීම

ශ්‍රී ලංකා සංඥා බළකා 79 වන සංවත්සර දිනයට සමගාමීව මව්බිමේ ඒකීයභාවය වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුවන්ගේ අමිල මෙහෙවර සිහිපත් කිරීමේ රණවිරු අනුස්මරණ උත්සවය සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන රණවිරු ස්මාරකය අභියසදී 2022 ඔක්තෝබර් මස 15 වන දින සන්ධ්‍යාවේ පැවැත්විනි. මෙම රණවිරු සැමරුම් උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරි හා සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් එච්එම්එල්ඩී හේරත් ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි සහභාගි වන ලදී. තවද එම රණවිරු සැමරුම් උත්සවය සඳහා විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන්, විශ්‍රාමික රෙජිමේන්තු සැරයන් මේජර්වරුන් හා මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන් සහභාගිවන ලදී.

එදිනම 79 වන සංවත්සර උත්සවයට සමගාමීව ආශිර්වාද පතා සංවිධානය කරනු ලැබූ සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනයක් ගරුතර මහා සංඝරත්නය සංඥා රෙජිමේන්තුව වෙත වැඩම කරවීමෙන් පැවැත්විණි. එමෙන්ම පසු දින එනම් 2022 ඔක්තොබර් 16 දින උදෑසන මහා සංඝරත්නය උදෙසා හීල් දානය පිරිනැමීමෙන් අනතුරුව බෞද්ධ ආගමික උත්සවය සමාප්තියට පත්විය. එම හීල් දානය පූජා කිරීමේ අවස්ථාව සඳහා යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරි හා



බ්‍රිගේඩියර් ඒකේඩී අධිකාරි යූඑස්පී
රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක

සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් එච්එම්එල්ඩී හේරත් ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන්, සෙසුනිලයන් සහ මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන් සහභාගී විය.





79 වන සංවත්සරය වෙනුවෙන් ශ්‍රී ලංකා සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් එච්එම්එල්ඩී හේරත් ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙත පිරිනමන ලද සම්මාන මුරය





79 වන සංවත්සරය වෙනුවෙන් පවත් වන ලද සියළු නිල භෝජන සංග්‍රහය

# සංඥා බළකාධිපති තනතුරෙහි වැඩ භාරගැනීම

මේජර් ජෙනරාල් කේඑඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයූ ජ්‍යෙෂ්ඨ නිලධාරි ශ්‍රී ලංකා සංඥා බළකායේ 16 වන බළකාධිපති වශයෙන් 2023.03.04 දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය, පනාගොඩ හිදී සිය තනතුරෙහි වැඩ භාරගන්නා ලදී. ඊට සමගාමීව එදින රෙජිමේන්තු මධ්‍යස්ථාන ප්‍රධාන දොරටුව අසලදී මධ්‍යස්ථාන සේනාවිධායක විසින් එම ජ්‍යෙෂ්ඨ නිලධාරී පිළිගැනීමෙන් අනතුරුව කඳවුරු මුරය පිරිනමන ලදී. ඉන් පසුව එම ජ්‍යෙෂ්ඨ නිලධාරි මියගිය රණවිරුවන් සිහිකරමින් මෙම රෙජිමේන්තු මධ්‍යස්ථාන රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දක්වන ලදී. අනතුරුව එම ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙනුවෙන් සම්මාන මුරයක් පවත්වන ලද අතර, බළකාධිපති තනතුර භාර ගැනීම සනිටුහන් කරනු වස් සදුන් පැලයක් රෝපනය කරන ලදී. පසුව එම ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් මෙම රෙම දේශන ශාලාවේදී සියළු නිලයින් ඇමතීමෙන් පසුව සෙසුනිල භෝජනාගාරයේදී පවත්වන ලද සියළු නිල තේපැන් සංග්‍රහය සදහා සහභාගි වන ලදී. ඉන් අනතුරුව නව බළකාධිපති විසින් රෙජිමේන්තු මධ්‍යස්ථාන සාකච්ඡා ශාලාවේදී පැමිණි සිටි සියළුම නිලධාරීන් ඇමතීමෙන් පසු නිලධාරි නිවස්නයේදී පැවැත්වූ දිවා භෝජන සංග්‍රහය සදහාද සහභාගි වන ලදී.













## රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක තනතුරෙහි රාජකාරි භාරගැනීම

කර්නල් ඒකේඩී අධිකාරි යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිළධාරි සංඥා බළකායෙහි 21 වන රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් 2023 ජනවාරි 04 වන දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය පනාගොඩ හීදී නව තනතුරෙහි වැඩ භාරගන්නා ලදී. එදින එම ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙනුවෙන් කදවුරු මුරයක් පිරිනමන ලද අතර, තත් ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් රෙම ශ්‍රීලංසංබ රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දක්වන ලදී. පසුව සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය සමග සමූහ ඡායාරූපකට පෙනී සිටීමෙන් අනතුරුව, රෙජිමේන්තු මධ්‍යස්ථාන කාර්යාලයේදී ආගමික වතාවත් සිදුකරන අතරතුර සුභ මොහොතින් සිය තනතුරෙහි වැඩ භාරගන්නා ලදී. පසුව මධ්‍යස්ථාන සේනාවිධායක විසින් සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයෙහි රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් ඇමතීමෙන් අනතුරුව සම්ප්‍රදායානුකූලව පවත්වන ලද සියළු නිල තේ පැන් සංග්‍රහයට සහභාගි වන ලදී.







## නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක තනතුරෙහි රාජකාරි භාරගැනීම



කර්නල් ඊඑන්පී ගුණවර්ධන යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිළධාරි සංඥා බළකායෙහි නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් 2023.01.25 දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය පනාගොඩ හීදී නව තනතුරෙහි වැඩ භාරගන්නා ලදී

## ශ්‍රී ලංකා සංඥා බළකායේ රෙජිමේන්තු මූලස්ථානය විසින් නිල උසස්වීම් ලැබූ මේජර් ජෙනරාල් ඩීඑම්පීපී දසනායක වෙත උපහාර දක්වයි

ශ්‍රී ලංකා සංඥා බළකාය විසින් 2023 පෙබරවාරි 10 වන දින රෙජිමේන්තු මූලස්ථානයේදී මෑතකදී උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ නිලධාරී මේජර් ජෙනරාල් ඩීඑම්පීපී දසනායක පිළිගැනීමේ උත්සවයක් පවත්වන ලදී. මධ්‍යස්ථාන සේනාවිධායක ශ්‍රී ලංකා සංඥා බළකාය, කර්නල් එකේඩී අධිකාරි යූඑස්පී විසින් එදින ප්‍රධාන ආරාධිත අමුත්තා ඇතුල්වීමේ දොරටුව අසලදී, කදවුරු ආරක්ෂක මුරයක් මගින් සම්ප්‍රදායානුකූලව පිළිගන්නා ලදී. මියගිය සියලුම රණවිරුවන් අනුස්මරණය කිරීම වෙනුවෙන් රණවිරු ස්මාරකය අභියස පුෂ්පෝපහාරයක් දක්වන ලදී. පසුව සමූහ ඡායාරූපයකට පෙනී සිටීමෙන් අනතුරුව රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ප්‍රධාන දොරටුව අසල පැළයක් රෝපණය කිරීමෙන් පසුව පවත්වන ලද තේ පැන් සංග්‍රහය අතරතුර, එම අවස්ථාවට සහභාගි වූ නිලධාරීන් සුහද පිළිසදරකට එක්වනු ලැබීය. අනතුරුව, මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි සියලුම නිලධාරීන් සමග දිවා භෝජන සංග්‍රහයකට එක්වූ අතර, එම අවස්ථාව සනිටුහන් කිරීම වෙනුවෙන් සංඥා බළකාය වෙත සමරු තිළිණයක් ද ප්‍රධානය කළේය.





## බළකායට අයත් සියලුම නිලයන්ගේ සුහද හමුව

සංඥා බළකායට අයත් සියලුම නිලයන්ගේ සේවය ඇගයීම සහ විනෝදාස්වාදය සැපයීම වස් සියලුම නිලයින්ගේ සහභාගිත්වයෙන් සංගීත සංදර්ශනයක් පැවැත්වීමට කටයුතු කරන ලදී. මෙම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස, සංඥා බළකාධිපති හා ප්‍රධාන සංඥා නිලධාරි මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයූ සහභාගී විය. මෙහිදී සම්ප්‍රදායික පොල්තෙල් පහන දැල්වීමෙන් අනතුරුව සංගීත සංදර්ශනය ආරම්භ වූ අතර, යුද්ධ හමුදා සංස්කෘතික නර්ථන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද මනරම් නැටුම් අංගයන් ගෙන් ප්‍රසංගය වඩාත් චමත්කාරජනක විය.









සංඥා බළකායට අයත් පුහුණු පාසලක් වශයෙන් පාඨමාලාවන්ට හා අධ්‍යයන කටයුතු වලට මුල්තැන දෙමින් නවීන තාක්ෂණයට අනුකූලව නිලධාරීන් හා සෙසුනිලයින් මෙන්ම යුද්ධ හමුදාවේ අනෙකුත් ඒකක නිළධාරී/සෙසුනිලයින්ගේ අභිවෘද්ධිය උදෙසා වාර්ෂික පුහුණු සැලැස්මට අනුකූලව ඉතාමත් උසස් තත්වයෙන් විවිධ පාඨමාලාවන් පවත්වනු ලබයි. ඒ අනුව මෙම වර්ෂය තුල සංඥා බළකායට අයත් නිලධාරී 34 දෙනෙකු සඳහා පාඨමාලා/වැඩමුළු 01 ක් හා සෙසුනිලයින් 934 දෙනෙකු සඳහා පාඨමාලා 15 ක්ද වෙනත් ඒකක නිලධාරීන් 02 දෙනෙකු ඇතුළු සහ සෙසුනිලයින් 169 දෙනෙකු සඳහා පාඨමාලා 08 ක් පවත්වා ඇත. තවද යුද්ධ හමුදා සාමාජිකයින්ට අමතරව යුද්ධ හමුදා සාමාජිකයින්ගේ දුවා දරුවන් සඳහා මෙම පුහුණු පාසල වෙතින් තොරතුරු තාක්ෂණ විෂයට සමගාමීව න්‍යායාත්මක හා ප්‍රයෝගික දැනුමින් යුත් පාඨමාලාවන් පවත්වන ලදී.



කර්නල් එම්ජීකේ ජයවර්ධන පීඑස්සී
සේනාවිධායක

යුද්ධ හමුදා ඉදිරි මාර්ගෝපාය දැක්ම සංකල්පයට අනුගත වෙමින් සංඥා බළකායේ සහ අනෙකුත් රෙජිමේන්තු තුල රාජකාරී කරනු ලබන නිලධාරී හා සෙසුනිලයින්ගේ වෘත්තිමය හැකියාවන් වර්ධනය කර ගැනීමටත් යුද්ධ හමුදා ජීවිතයෙහි ඉදිරි අභිවෘද්ධිය පිණිස සංඥා පුහුණු පාසල් ඉතිහාසය වෙත නව පරිච්ඡේදයක් එක් කරමින් තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට අනුබද්ධිතව ජාතික වෘත්තීය නිපුණතා සහතික 5 වන මට්ටම යටතේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවක් අරම්භකරන ලද අතර, දැනට වෙනත් ඒකක නිලධාරී 07 දෙනෙකුගේ සහ සංඥා බළකායට අයත් සෙසුනිළයින් 01 අයෙකුගේ සහභාගීත්වයෙන් හය මසක කාලයක් සඳහා අදාල පාඨමාලාව මේවන විට ආරම්භකර ඇත. තවද, වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට අනුබද්ධිතව ජාතික වෘත්තීය නිපුණතා සහතික නවීන තාක්ෂණයෙහි දියුණුවට සමගාමීව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයපතය යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත.

සංඥා බළකායේත් සංඥා පාසලේත් ඉතිහාසයට නව පරිච්ඡේදයක් එක් කරමින් සංඥා බළකාධිපති තුමාගේ සහභාගීත්වයෙන් හා ප්‍රධානත්වයෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබද මූලික පාඨමාලා අංක 129 සහ 130 හි සංඥා නිල ලාංජන පැලඳවීමේ පෙළපාලි මහත් උත්කර්ෂවත් අන්දමින් 2023 ජූලි මස 14 වන දින පැවැත් වුනි.

සේනාවිධායකගේ හා ප්‍රධාන උපදේශකගේ මගපෙන්වීම යටතේ සංඥා පුහුණු පාසලෙහි මෙතෙක් අඩුපාඩුවකව පැවති ආපන ශාලාවක් නවතමයෙන් ඉදිකර ඇත. එමෙන්ම කඳවුරෙහි රාජකාරී කරනු ලබන සෙසුනිළයින්ගේ මෙන්ම පාඨමාලා/වැඩමුළු සඳහා සහභාගිවන නිලධාරීන් හා සෙසුනිලයින්ගේ ප්‍රයෝජනය වෙනුවෙන් හඨනිවාස ප්‍රතිසංස්කරණය කිරීම, වැසිකිළි පද්ධති හා නාන කාමර ඇලුත්වැඩියා කිරීම වැනි යටිතල පහසුකම් වැඩිදියුණු කරන ලද අතර, සම්මාන මුර පීඨිකාවෙහි අලංකාරවත් ලෙස පැති බැම්මක් ඉදි කරන ලදී. තවද, රටෙහි පැන නැගී ඇති ආර්ථික අර්බුදය හමුවේ ඇතිවු ආහාර හිඟයට පිළියමක් වශයෙන් මෙම පුහුණු පාසල් භූමියෙහි ආහාර භෝග හා එළවළු වර්ග වගා කිරීමට කටයුතු සිදු කරගෙන යනු ලබන අතර, එමගින් ලැබෙන අස්වැන්න සුභ සාධක වෙළඳසැලක් ආරම්භකර සියළුම නිලධාරී/සෙසුනිලයින් වෙත සහනදායි මිල ගණන් යටතේ අලෙවි කිරීමට කටයුතු සිදුකරමින් පවති.





අභිනවයෙන් රාජකාරී භාරගත් නව බළකාධිපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී සංඥා පුහුණු පාසල වෙත සිදුකරනු ලැබූ සංචාරය





2023 ජුලි මස 14 දින පැවති මූලික තොරතුරු තාක්‍ෂණ හා සන්නිවේදන පාඨමාලාව අංක 30 හි විසිරයාමේ උත්සවය






2023 මැයි මස 15 දින කර්නල් බීඩී ප්‍රනාන්දු යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි සේනාවිධායක ධූරයෙන් නික්ම යෑම





2023 ජුනි මස 19 දින කර්නල් එම්ජ්කේ ජයවර්ධන පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී නව සේනාවිධායක ලෙස වැඩ ආරම්භ කිරීම





නිලධාරීන් සදහා සංඥා පුහුණු පාසල වෙතින් පවත්වාගෙන යන ලද පාඨමාලාවන් තුළදී පැවැත්වූ පුහුණු අභ්‍යාස





සෙසුනිල සදහා සංඥා පුහුණු පාසල වෙතින් පවත්වාගෙන යන ලද පාඨමාලාවන් තුළදී පැවැත්වූ පුහුණු අභ්‍යාස



පර්යේෂණ සංකල්ප හා මූලධර්ම අධ්‍යක්ෂ මණ්ඩල පුහුණු අධීක්ෂණ සංචාරය



පාඨමාලාවන් අතරතුර හන්තාන සම්ප්‍රේෂණ කුළුණ වෙත සිදුකරනු ලැබූ සංචාරය



ප්‍රධාන උපදේශක වශයෙන් මේජර් එම්ඒඑස්එස් මුතුගොඩ යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි වැඩභාර ගැනීම



ප්‍රධාන මාණ්ඩලික නිලධාරි 2 (පුහුණු) වශයෙන් මේජර් එම්එම්යූඅයිබී වැව්ගෙදර පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි වැඩභාර ගැනීම



පුහුණු පාසල් භාර බලලත් නිලධාරි ලෙස බනි 1 අයිඑම්කේබී රත්නායක යූඑස්පී වැඩ භාරගැනිම



නිලධාරී/සෙසුනිල සුහසාධනය වෙනුවෙන් ජන අවන්හල නවීකරණය කර නැවත ආරම්භ කිරීම

# 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය



**මේජර් පීටීකේ ද සිල්වා ආර්එස්පී යූඑස්පී එල්එස්සී**
**අණදෙන නිලධාරී**

වර්ෂ 1943 ඔක්තෝබර් මස 19 වන දින උපත ලද ශ්‍රී ලංකා සංඥා බළකා නාමයෙහි පෙර ගමන්කරු ලෙස වසර 79 කට අධික ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියනු ලබන 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය 1958 ඔක්තෝබර් මස 14 වන දින ඒකකයක් ලෙස නගා සිටුවීම සිදුකර ඇත. වර්තමානයේ මෙම ඒකකය මුලතිව් දිස්ත්‍රික්කයේ වට්ටප්පලෙයි ප්‍රදේශයේ ස්ථානගතව ඇති අතර, ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) බලප්‍රදේශයට අයත් මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි පිහිටා ඇති සේනාංක මූලස්ථාන, බලසේනා මූලස්ථාන, ඒකක, බළඇණී පුහුණු පාසල්, යුද්ධ හමුදා රෝහල (මුලතිව්) සහ අනෙකුත් යුද්ධ හමුදා මූලස්ථාන/අනුබණ්ඩ වෙත සංඥා සම්බන්ධතාවයන් ලබාදීම මෙන්ම ස්ථාපනය කරන ලද සංඥා සම්බන්ධතා ක්‍රමවත්ව පවත්වාගෙන යාම සිදුකරනු ලබයි. එමෙන්ම ප්‍රධාන සංඥා නිලධාරි කාර්යාලය සහ සංඥා බලසේනා මූලස්ථානයේ උපදෙස් ප්‍රකාරව මෙම බලප්‍රදේශය තුළ පිහිටා ඇති සංඥා කුළුණු අලුත්වැඩියාව හා ගුවන් විදුලි ජාලයන් ක්‍රමවත්ව පවත්වා ගෙන යාම සිදුකරනු ලබයි.

සංඥා බළකා ප්‍රතිව්‍යුහගතකරන සැලසුම් යටතේ මෙම බල ප්‍රදේශයන්හි තොරතුරු තාක්ෂණ රාජකාරී ආවරණය කරමින් සිටි 6 ශ්‍රීලංසංබ ඒකකය යුහමු තුළ ස්ථාපනයවීමත් සමග තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (**ICT**) ඒකකයක් ලෙස අභියෝගයන්ට මුහුණදීමට හැකිවන පරිදි ඒකකයට අයත් සෙසුනිලයින්ගේ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් සහ ඔවුන් තාක්ෂණික හා සන්නිවේදනයට අයත් සියලු විෂයයන් පිළිබඳව මනා දැනුමකින් යුතු සෙබළුන් බවට පත්කිරීමේ අරමුණින් අදියරයන් වශයෙන් ඒකකය තුළ පුහුණු සැසි පවත්වනු ලබයි. තවද වෘත්තීයමය පරිණතභාවයෙන් යුතු සංඥා සෙබළුන් පිරිසක් බිහි කර ගැනීම සඳහා යුද්ධ හමුදා පුහුණු පාසැල් මගින් පවත්වනු ලබන පාඨමාලා/වැඩමුළු සඳහා මෙම ඒකක සෙබළුන් යොමුකර ඔවුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කර ගැනීමට අවැසි ඉදිරි කටයුතු සිදුකර ඇත.

එමෙන්ම ඒකක අණදෙන නිලධාරීගේ විශේෂිත මග පෙන්වීම යටතේ 2023 වසරේදී අන්තර් ඒකක ක්‍රීඩා ඉසව්වලදී මෙම ඒකකය නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් විශේෂ දක්ෂතා දක්වමින් ජයග්‍රහණ රැසක් හිමිකර ගැනිමට සමත්වන ලදී. ඒ අතුරින් වොලිබොල්, බාස්කට් බෝල්, ටෙනිස් (පිරිමි සහ කාන්තා), ටේබල් ටෙනිස් (කාන්තා), කරාතේ (කාන්තා) සහ ස්කොෂ් (කාන්තා) ක්‍රීඩා ඉසව්වන්ගෙන් ශූරතාවයද ක්‍රිකට්, කැරම්, ජූඩෝ, කරාතේ (පිරිමි), ස්කොෂ් (පිරිමි), ඔරු පැදිම (පිරිමි සහ කාන්තා), සහ මළල ක්‍රීඩා ඉසව්වන්ගෙන් අනු ශූරතාවයද, සව් එසවීම, ගොල්ෆ් (කාන්තා), බැඩ්මින්ටන් (කාන්තා), පාපැදි සහ එල්ලේ යන ක්‍රීඩා ඉසව්වන්ගෙන් තුන්වන ස්ථානයද හිමි කර ගැනීම විශේෂයෙන් සඳහන් කළ හැක.





ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන සංඥා නිලධාරි සහ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් කේඑඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරි 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය වෙත 2023 ජුලි මස 15 වන දින සිදු කරන ලද ඒකක සංචාරය





ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සංඥා බළසේනාධිපති කර්නල් එච්ඩීජේපී වීරතුංග ජ්‍යෂ්ඨ නිලධාරී සංඥා බලසේනාධිපති ධුරය භාර ගැනීමෙන් අනතුරුව මුලතිව්හි ස්ථාපිත 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය වෙත 2023 අප්‍රේල් මස 05 වන දින සිදුකරන ලද ඒකක සංචාරයෙහි විශේෂ අවස්ථා





මෙම ඒකකයේ 30 වන අණදෙන නිළධාරී වශයෙන් මේජර් පීටීකේ ද සිල්වා ආර්එස්පී යූඑස්පී එල්එස්සී ජ්‍යෂ්ඨ නිලධාරී 2023 මාර්තු මස 28 වන දින සුභ මොහොතින් වැඩ භාරගන්නා ලද අවස්ථාව





මෙම ඒකක සෙනීන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ (IT) අංක - 01 පාඨමාලාව 2023 ජුනි මස 26 දින සිට 2023 ජුලි මස 11 වන දින දක්වා පවත්වන ලදී

# 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය



ලුතිනන් කර්නල් යුඑල්සීඩී පෙරේරා පීඑස්සී
අණදෙන නිලධාරි

වසර 35 ක ප්‍රෞඩ ඉතිහාසයකට උරුමකම් කියන 3 වන සංඥා රෙජිමේන්තුව එහි ආරම්භය සනිටුහන් කල වර්ෂ 1989 ක් වු මාර්තු මස 09 වන දින පටන් මේ දක්වා වු දිර්ඝ කාලයක් මුළුල්ලේ මව්බිම හා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙනුවෙන් ඉටුකලා වු අභිමානවත් සේවය පිළිබදව නිහතමානීව ආඩම්බරයට පත්වන්නෙමු.

මෙම රෙජිමේන්තුව ආරම්භ කල දින සිට මාතෘ භූමියේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය උදෙසා ත්‍රස්තවාදයට එරෙහිව සිදුකල යුද්ධයෙහි ජයග්‍රාහි දිනය වන 2009 මැයි මස 18 වන දින දක්වාත් එතැන් පටන් මේ දක්වාත් සියලු ශ්‍රී ලාංකිකයන් අත්විදින සාමකාමී වාතාවරණය තුලත් නිසි සංඥා සම්බන්ධතාවයන් පවත්වමින් සංඥා රාජකාරි මෙන්ම පාබල රාජකාරීන් ද ඉටුකරමින් විවිධ වු තාක්‍ෂණික ඥාණයෙන් මෙන්ම අඛණ්ඩ කැපවීමෙන් ජාතිය ගොඩනැගීමේ මහගු ක්‍රියාදාමයට ද දායකවෙමින් මෙම රෙජිමේන්තුවේ සියලුම නිලයින් විසින් ඉමහත්වු ශ්‍රමයෙන්, කායදානයෙන් හා ප්‍රාණදානයෙන් ඉටුකල සේවය අමිල වේ. අනුපමේය වේ. ගෞරවනීය වේ.

මේ අතර ඒකකයේ 34 වන සංවත්සරයට සමගාමීව චාම් උත්සව මාලාවක් ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් සංවිධානය කරන ලද අතර, එහිදී අභිමානවත් අයුරින් ඒකක අණදෙන නිලධාරි හට සම්මාන පෙළපාලියක් කදවුරු මුරයක් පිරිනමන ලද අතර, ඒකකයේ නිලධාරීන්ගෙ හා සෙසුනිලයින්ගේ සහභාගිත්වයෙන් සියළු නිල සුහද හමුවක් හා සියළු නිල භෝජන සංග්‍රහයක් පවත්වන ලදී. තවද 3 ශ්‍රීලංසංබ ඒකකය ආරම්භයේ සිට මේ දක්වා රාජකාරී කර ක්‍රියාන්විත හේතුන් මත මියගිය සියළු නිලධාරීන් හා සෙසුනිලයින් සිහිපත් කරමින් ගෞරවනීය මහා සංඝරත්නය ඒකකය වෙත වැඩමවා දානමය පිංකමක් සිදු කරන ලදී.

තවද, වත්මන් අණදෙන නිලධාරි ලෙස රාජකාරී ඉටුකරනු ලබන ලුතිනන් කර්නල් යුඑල්සීඩී පෙරේරා පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ මග පෙන්වීම යටතේ පහත දක්වා ඇති පාඨමාලාවන් මෙම ඒකකය තුල ඉතා සාර්ථකව පවත්වා ඇත.

- කෝප්‍රල් සිට සැරයන් දක්වා නිල උසස් කිරීමේ පාඨමාලාවන් 02 ක්.
- බහුවිධ නිපුනත්වයෙන් යුත් සෙබළුන් බිහිකිරීමේ පාඨමාලා 04 ක්.
- පාබල ඒකක නිලධාරීන් හා සෙසුනිලයින් වෙනුවෙන් සංඥා හා සයිබර් ආරක්‍ෂාව සබැදි පුහුණු වැඩමුළු අධියර 2 ක් යටතේ පාඨමාලා 8 ක් පවත්වන ලදී.

එසේම, 6 ශ්‍රීලංසංබ ඒකකය ආසේමු (යා) බළප්‍රදේශයෙන් ඉවත්ව යුහමු තුල ස්ථාපනය වීමෙන් පසු ආසේමු (යා) බළප්‍රදේශය තුල එම ඒකකය විසින් ආවරණය කල තොරතුරු තාක්‍ෂණික රාජකාරීද ඉතා සාර්ථකව මෙම ඒකකය වෙතින් ඉටුකරමින් පවතී

අවසන් වශයෙන් 34 වසරක කඩඉම පසුකර 35 වන වසරට පා තබා සිටින මෙම ඒකකය ආරම්භයේ සිට මේ දක්වා පැමිණි ගමන් මගෙහි සාර්ථකත්වයට දායකවෙමින් දිවිහිමියෙන් රාජකාරී කල සියළුම නිලධාරීන් හා සෙසුනිලයින් ද දැනට රාජකාරීයේ යෙදී සිටින සියළුම නිලධාරීන්, සෙසුනිලයින් හා සිවිල් සේවක මහතුන්ද ඉතාමත් භක්තියෙන් සිහිපත්කරමින් මෙවන් මෙහෙවරක් ඉටු කල 3 වන සංඥා රෙජිමේන්තුවෙහි නාමය සමස්ථ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල දිප්තිමත් ඒකකයක් ලෙස දිනෙන් දින දියුණුවට පත්වේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.





ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන සංඥා නිලධාරි සහ සංඥා බළකායේ බළකාධිපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරි මෙම ඒකක සංචාරය කිරීමේ අවස්ථාව





ආරක්ෂක සේනාව (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීබීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී මෙම ඒකක සංචාරය කිරීමේ අවස්ථාව





තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් පීඑල්එස්ඩබ්ලිව් ලියනගේ යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ ඒකක සංචාරය






සංඥා බළසේනාධිපති කර්නල් එච්ඩීජේපී වීරතුංග ජ්‍යෙෂ්ඨ නිළධාරී මෙම ඒකක සංචාරය කිරීමේ අවස්ථාව





මෙම ඒකක 34 වන සංවත්සරයට සමගාමීව අණදෙන නිලධාරී වෙත පිරිනමන ලද සම්මාන පෙළපාලියේ හා කදවුරු මුරයේ අවස්ථාවන්

## 4 වන රෙපිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය



මේජර් ඩබ්ලිව්එච්එම්ජේ විජේරත්න පීඑස්සී
අණදෙන නිලධාරී

වර්ෂ 1991 ජුනි මස 05 දින ආරම්භකර වසර 32 ක අභිමානය සමරනු ලබන 4 වන රෙපිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය මේ වන විට ආරක්‍ෂක සේනා මුලස්ථානය (වන්නි) යටතේ පාබල සේනාංක 04 ක්, පාබල බලසේනා මුලස්ථාන 12 ක් පාබල/ආධාරක/සේවා බළඇණි 31 ක් ඇතුළුව රෙපිමේන්තු මධ්‍යස්ථාන, පුහුණු පාසැල් සහ අනෙකුත් ස්වාධීන ආයතනයන් සඳහා සංඥා සම්බන්ධතාවය සැපයීම තුලින් ලබාදෙන ලද දායකත්වය වෙනුවෙන් මෙම ඒකකය උසස් මුලස්ථානයන්ගේ පැසසුමට නිරන්තරයෙන් ලක්වෙමින් ශ්‍රී ලංකා සංඥා බළකායට ගෞරවයක් සහ කීර්තියක් අත්කර දෙන ලද අතර, දැනට මෙම ඒකකය අනුරාධපුර නගරයට යාබදව ස්ථානගතව ආසේමු (වන්නි) බලප්‍රදේශයේ අණ හා පාලනයට අවැසි සන්නිවේදන සහ තොරතුරු තාක්‍ෂණ සේවාවන් සැපයීමේ රාජකාරි නොපිරිහෙලා ඉටු කරනු ලබයි.

වසර 32 ක සාඩම්බර ඉතිහාසයකට උරුමකම් කියනු ලබන මෙම ඒකකයෙහි 2023 ජුනි 05 වන දිනට යෙදී තිබුණු ඒකක සංවත්සරය පැවැත්වූ අතර, අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධිය අසල පවත්වන ලද ආගමික වතාවත්, ඒකක ධජයට සෙත් පැතීමට අමතරව අනුරාධපුර නගරයෙහි ළමා නිවාසයක් වෙනුවෙන් දානයක් පිලිගැන්වීම සහ වැඩිහිටි නිවාසයක ශ්‍රමදානයක් සංවත්සර දිනයට සමගාමීව සිදුකරන ලදී. තවද මෙම ඒකකයට අයත් ක්‍රියාන්විත හේතූන් මත මියගිය නිලධාරී/සෙසුනිලයින් සිහිකිරීම වස් ඔවුන්ගේ නිවෙස් වෙත සමරු ඵලකයක් ලබාදෙන ලදී.

සංඥා බළකායට අයත් හඨ පිරිස් එක් වෘත්තියකට සීමානොවී සියළු වෘත්තීන්හි නිපුණත්වයක් ප්‍රගුණ කිරීම් අරමුණින් සංඥා බසේමු හි උපදෙස් පරිදි මේ වන විට MULTI SKILLED SOLDIER පාඨමාලාවෙහි අධියර 13 ක් සාර්ථකව අවසන් කරන ලද අතර, ඒ තුලින් ඒකකයට අයත් සෙසුනිළයින් සියයකට අධික සංඛ්‍යාවක් පරිගණක භාවිතය, ජන ඇමතුම් රාජකාරීන්, CCTV රාජකාරීන්, බහුප්‍රේෂණ යන්ත්‍ර භාවිතය ඇතුළු සියළුම සංඥ වෘත්තීන් සබැදිව පුහුණු කර සේනාංක සහ බලසේනාවන්හි සංඥා රාජකාරී සඳහා මුදාහැර ඇත.

වත්මන් අණදෙන නිලධාරීගේ මගපෙන්වීම යටතේ ඒකකයේ සියළුම නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ කැපකිරීම හා නොපසුබට උත්සාහය හේතුවෙන් මෙන්ම ප්‍රධාන සංඥා නිලධාරී, සංඥා බළකාධිපති, සංඥා බළසේනාධිපති ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ උපදෙස් පරිදි නිසි අයුරින් රාජකාරීන් ඉටුකරනු ලබන 4 වන සංඥා රෙපිමේන්තුවෙහි නාමය සමස්ථ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ දීප්තිමත් ඒකකයක් ලෙස දිනෙන් දින දියුණුවට පත්වේවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.









ශ්‍රී ලංකා යුද හමුදා ප්‍රධාන සංඥා නිලධාරි හා රෙපිමේන්තු බළකාධිපති වශයෙන් රාජකාරී කරනු ලබන මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් සිදු කරන ලද මෙම ඒකක ප්‍රථම නිල කඳවුරු සංචාරය.









ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා බළසේනාධිපති වශයෙන් රාජකාරි කරනු ලබන කර්නල් එච්ඩීජේපී වීරතුංග ජ්‍යෙෂ්ඨ නිළධාරි විසින් සිදු කරන ලද මෙම ඒකක කඳවුරු සංචාරය





ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් සිදුකල 32 වන මෙම ඒකක සංවත්සර උත්සවයේ විශේෂ අවස්ථා



මෙම ඒකකයේ 22 වන අණදෙන නිළධාරි වශයෙන් මේජර් ඩබ්ලිව්එච්එම්ජේ විජේරත්න පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි 2023 අගෝස්තු මස 18 වන දින සුභ මොහොතින් වැඩ භාරගන්නා ලද අවස්ථාව



මේජර් ඒපීඑන්එස් විරසේන පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි දෙවන අණදෙන නිලධාරි තනතුරේ රාජකාරී භාරගැනීම

## 5 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය

5 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය 2014 දෙසැම්බර් මස 15 වන දින ආසේමු (බටහිර) බලප්‍රදේශයේ සංඥා රාජකාරීන් ඉටු කිරීම සඳහා ස්ථානගතවන ලදී. ඒකකය මේ වන විට මෙනේරිගම, පාදුක්ක ප්‍රදේශයේ කඳවුරෙහි ස්ථානගතව බලප්‍රදේශයේ දිස්ත්‍රික්ක 09 කට අයත් සේමු/බසේමු/ඒකක හා පුහුණු පාසල් ආවරණය කරමින් සාර්ථකව සංඥා රාජකාරීන් ඉටුකරමින් පවතී.

මෙම ඒකකයේ ප්‍රධානතම වගකීම් වනුයේ ආසේමු (බටහිර) බලප්‍රදේශයේ යුධ හමුදා ගුවන් විදුලි සංඥා සම්බන්ධතා පවත්වාගෙන යාම. රාජ්‍ය උත්සව මෙන්ම යුද්ධ හමුදා උත්සවයන් සඳහා ජන ඇමතුම් උපකරණ සේවාව සැපයීම, සියළුම ස්ථානයන්හි දුරකථන මාර්ග නඩත්තු සේවාව සැපයීම හා ගුවන් විදුලි යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ සේවාව සැපයීම වේ. ඒකකය වෙත පැවරී ඇති මුලික රාජකාරීන්ට පරිභාහිරව හදිසි ආරක්ෂක කටයුතු වෙනුවෙන් භඨපිරිස් ලබාදීමද සිදුකරනු ලැබේ.

එමෙන්ම හරිත කෘෂිකර්ම වැඩසටහන යටතේ ඒකකයේ වගාකල හැකි සෑම භූමි ප්‍රදේශයකම ආහාර බෝග වගා කිරීමට කටයුතු කර ඇත. මීට පරිභාහිරව හදිසි තත්වයන් තුල බලප්‍රදේශයේ ආරක්ෂාව නිසි පරිදි තහවුරු කරගනිමින් යුද්ධ හමුදාවේ ප්‍රථිරූපය ඉහල තලයකට ගෙන ඒමට සෘජු දායකත්වයක් ලබාදිමට හැකිවී ඇත.

මීට අමතරව 2023 පෙබරවාරි 04 දින පැවැති ජාතික නිදහස් සැමරුම් උත්සවය සඳහා සියළුම ගුවන් විදුලි සංඥා සම්බන්ධතාවයන් මෙම ඒකකය වෙතින් ලබාදෙමින් එම කාර්යයන් සාර්ථකව ඉටුකර ගැනිමට මහගු දායකත්වයක් ලබාදෙන ලදී. ඒකකයේ අණදෙන නිලධාරිගේ පුර්ණ මගපෙන්වීම යටතේ සියළුම නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ



මේජර් ආර්එම්කේයුකේ රත්නායක යුඑස්පී
අණදෙන නිලධාරි

නොමද කැපකිරීම සහ නොපසුබට උත්සාහය මත හා සංඥා බළකාධිපති තුමාගේ උපදෙස් පරිදි නිසි අයුරින් රාජකාරීන් ඉටු කරමින් බලප්‍රදේශයේ සංඥා සම්බන්ධතාවයන් පවත්වා ගැනිමටත් අභ්‍යන්තර ආරක්ෂක කටයුතු සඳහා යොදවන ලද භඨපිරිස් වෙත අවශ්‍ය ක්ෂණික සංඥා සම්බන්ධතාවයන් ලබාදීමෙන් හා හදිසි තත්වයන් වලදි යුද්ධ හමුදා මුලස්ථානයේ උපදෙස් පරිදි කටයුතු කිරීම මගින් මෙම ඒකකය ප්‍රදේශයේ සිවිල් ජනතාවගේ හා යුධ හමුදා ඉහල මුලස්ථාන ඇගයීමට ලක්ව ඇත.





ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති විසින් 2023 ජුලි මස 28 වන දින සිදුකරන ලද ඒකක කදවුරු සංචාරය





මෙම ඒකකයෙහි නව අණදෙන නිලධාරි වශයෙන් මේජර් ආර්එම්කේයුකේ රත්නායක යුඑස්පී ශ්‍රීලංසංබ ජ්‍යෙෂ්ඨ නිලධාරි 20 වන අණදෙන නිලධාරි ලෙස 2023 මැයි මස 02 වන දින අභිනවයෙන් වැඩ භාරගැනීම









2023 ජුනි මස 16 වන දින සංඥා බළකාධිපති සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් යුතුව නවතමයෙන් ඉදිකරන ලද මර්කරි රිසෝට් නිවාඩු නිකේතනය විවෘත කිරීම





මෙම ඒකක 29 වන සංවත්සර උත්සවයේ විශේෂ අවස්ථා



නිලධාරී/සෙසුනිලයින් හට හා ප්‍රදේශයේ සිවිල් ජනතාව වෙනුවෙන් සහනදායි ලෙස කොණ්ඩා කැපීම සඳහා කරණවැමි හලක් 2023 ජුලි මස 18 වන දින නවතමයෙන් ඉදිකර විවෘත කිරීම



මෙම ඒකක සංඥා සම්බන්ධතා බළඝණ වෙතින් පිදුරුතලාගල කඳු මුදුණෙහි පිහිටි ඇන්ටනා කුළුණෙහි ආසේමු (බටහිර) බළ ප්‍රදේශය ආවරණය කිරීමට චීන සමුහාන්ඩුව වෙතින් ලබාදී ඇති හයිටෙරා ගුවන් විදුලි ජාලයක් ස්ථාපිත කිරීම සඳහා රිපීටර් යන්ත්‍රයක් ස්ථානගත කර සංඥා සම්බන්ධතාවය ලබාදීම

# 5 ශ්‍රී ලංකා සංඥා බළකායේ නියමුවන්ගේ සුහද හමුව

රුදුරු එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ට එරෙහිව පාබල රාජකාරීන් ඉටුකිරීම සඳහා 1994 ජනවාරි මස 02 වන දින සංඥා බළකායේ වැදගත් සන්දිස්ථානයක් සනිටුහන් කරමින් සංඥා රෙජිමේන්තුවේ පලමු ආධාරක බළඇණිය ලෙස මේජර් ජෙනරාල් ඊපී ද ඉසෙඩ් අබේසේකර (විශ්‍රාමික) ජ්‍යෂ්ඨ නිලධාරිගේ පලමු අණදීම යටතේ මෙම ඒකකය දේවහුව යුධ හමුදා කඳවුරු පරිශ්‍රයේදී නගාසිටුවන ලද අතර, එම ආරම්භක අවස්ථාවේ ඒකකයට අනුයුක්තව රාජකාරියෙහි නියුතු වූ සියළුම ජ්‍යෂ්ඨ/කනිෂ්ඨ නිලධාරීන්ගේ සුහද හමුවක් 2023 ජූලි මස 09 වන දින 5 ශ්‍රීලංසංබ කදවුරු පරිශ්‍රයේ ස්ථාපිත මර්කරි ක්ලබ් හවුස් ඇන්ඩ් ඇඩ්වෙන්චර් පාක් හිදී මේජර් ජෙනරාල් ඊපී ද ඉසෙඩ් අබේසේකර (විශ්‍රාමික) නිලධාරීගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර, එම අවස්ථාවට වර්තමාන සංඥා බළකායේ බළකාධිපති මේජර් ජෙනරාල් කේඑඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු ජ්‍යෂ්ඨ නිලධාරි විශේෂ ආරාධිත අමුත්තා ලෙස සහභාගී වන ලදී. තවද ඒකකය නගාසිටුවීමේ සිට යුධමය වාතාවරණය තුලදී මෙන්ම ඉන් පසු කාල පරිච්ජේදයේදීද ඒකකයේ සෙනීන්ගේ ජීවිත ආරක්‍ෂාව හා ඔවුන්ගේ සියළු පාලන කටයුතු මෙන්ම ඒකකයේ  අභිවෘද්ධිය වෙනුවෙන් අභීතව තම නායකත්වය ලබාදෙමින් මෙම ඒකකයට අණදීම සිදුකරන ලද සියළුම ජ්‍යෂ්ඨ නිලධාරීන්ද ආරාධිතයින් ලෙස එම අවස්ථාවට සහභාගී වූ අතර, මෙම ඒකකය තුල වර්තමානයේ රාජකාරියෙහි නියුතු සියළුම ජ්‍යෂ්ඨ/කනිෂ්ඨ නිලධාරීන්ද එම අවස්ථාවට සහභාගී වන ලදී.

තවද උදෑසන ආරම්භ කර දවස පුරා පැවැත්වූ සුහද හමුවේදී මෙම මර්කරි ක්ලබ් හවුස් ඇන්ඩ් ඇඩ්වෙන්චර් පාක් හි පවතින ක්‍රියාකාරකම් සඳහාද විශ්‍රාමික ජ්‍යෂ්ඨ නිලධාරීන් සහ සේවයේ නියුතු ජ්‍යෂ්ඨ නිලධාරීන් ඉතාමත් උද්යෝගයෙන් යුතුව සහභාගී වූ අතර, ඒකකයේ වර්තමාන අණදෙන නිලධාරි වන මේජර් ආර්එම්කේයුකේ රත්නායක යුඑස්පී ජ්‍යෂ්ඨ නිලධාරි විසින් ඒකකයේ ප්‍රෞඪ ඉතිහාසය, වර්තමාන ක්‍රියාකාරකම්, සහ අනාගත සැලසුම් පිලිබඳව සහභාගීවූ විශ්‍රාමික ජ්‍යෂ්ඨ නිලධාරීන්/සේවයේ නියුතු ජ්‍යෂ්ඨ නිලධාරීන් හට ඉදිරිපත් කිරීමක්ද සිදුකරන ලදී. තවද පැමිණි සිටි සියළුම නිලධාරීන් ඒකකයෙහි අභිවෘද්ධිය වෙනුවෙන් අනාගතයේදී තම සක්‍රීය දායකත්වය ලබාදීමට කටයුතු කරන බවද ඒකකයේ අනාගතයට සුභ පැතීමටද ක්‍රියා කරන ලදී.





මෙම ඒකකයේ 3 වන අණදෙන නිලධාරි ලෙස රාජකාරි සිදුකරනු ලැබූ කර්නල් කේඑම් නවරත්න යුඑස්පී ජ්‍යෂ්ඨ නිලධාරි බුද්ධ ශාසනයේ චිරස්ථිතිය උදෙසා ඇපකැප වෙමින් වර්ථමානයේදී මහනුවර විමලසිරි නමින් උතුම් පැවිදි දිවියට එළඹ ඓතිහාසික නාගල කන්ද ආරණ්‍ය සේනාසනයේ වැඩවාසය කරනු ලබන අතර, උන්වහන්සේ ද එම උත්සව අවස්ථාවට වැඩම කරනු ලැබීය





## 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය



මේජර් එම්සී වුක්කාවඩු
අණදෙන නිලධාරී

වසර 30 කට අධික කාලසීමාවක් පැවති කුරිරු යුද්ධය නිමා කිරීමට සක්‍රීයව දායකත්වයක් ලබාදුන් මෙම ඒකකය සංඥා බළකායේ දෙවන ආධාරක බළඇණිය ලෙස 1997 ජනවාරි මස 10 වන දින ආරම්භ කරන ලදී. වසර 26 කට අධික සාඩම්බර අතීතයකට උරුමකමක් ඇති මෙම ඒකකය ආධාරක බළඇණි රාජකාරි වලින් මිදී තොරතුරු තාක්ෂණ ඒකකයක් ලෙස 2014 ජුනි මස 16 වන දින ප්‍රතිව්‍යුහගත කරන ලද අතර, ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු මෙම වර්ෂයේදී 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය සිය නව වන සංවත්සරය සමරන ලදී. තවද, ඒකකයේ 9 වන සංවත්සරය 2023 ජුනි මස 16 වන දිනට යෙදී තිබූ අතර, එයට සමගාමීව මෙම ඒකකය ආධාරක බළඇණියක් වශයෙන් තිබියදී ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිට තම ජීවිත පුදකල රණවිරුවන් සිහිකිරීම සඳහාත්, තුවාල ලබා ආබාධිත තත්වයට පත්ව සිටින රණවිරුවන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීම සහ දැනට සේවයේ යෙදී සිටින රණවිරුවන්/සිවිල් සේවක මහතුන් හට සෙත් පැතීම සඳහා අණදෙන නිලධාරිතුමාගේ පූර්ණ අධීක්ෂණය යටතේ කොළඹ ගංගාරාම විහාරස්ථානයේදී බෝධි පූජාමය පිංකමක් ඒදින පවත්වන ලදි. තවද, සංවත්සර දිනයට සමගාමීව ඒකකයේ රාජකාරී කරනු ලබන නිලධාරීන් හා සෙසුනිලයින් අතර සුහදතාවය වර්ධනය කිරීමේ අරමුණින් 2023.06.29 වන දින 5 ශ්‍රීලංසංබ ඒකක මුලස්ථානයේදී ක්‍රිකට් තරගාවලියක් සහ සියලු නිළ සුහද හමුවක් පවත්වන ලදී.

තොරතුරු තාක්ෂණ ඒකකයක් වශයෙන් යාපනය නගරයේ පෞරාණික ලන්දේසි බලකොටුව ආසන්නයේ කලපු තීරයට මායිම්ව ස්ථානගතව, 1 බළකාය, ආසේමු (යා), ආසේමු (වන්නි) හා ආසේමු (මු) ආරක්ෂක සේනා බලප්‍රදේශයන් තුළ තොරතුරු තාක්ෂණ රාජකාරී ආවරණය කරමින්, උසස් මුලස්ථානයන් වෙතින් පැවරෙන රාජකාරීන් හා වගකීම්ද ඉතා උසස් අන්දමින් ඉටුකරමින්, පරිගණක ක්ෂේත්‍ර වැඩපල යාපනය, රණවිරු තොරතුරු සම්පත් කේන්ද්‍රය යාපනය, පරිගණක මූලික වැඩපල කොකාවිල්, රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනය කොකාවිල්, අනුරාධපුරය සහ පරිගණක ක්ෂේත්‍ර වැඩපල අනුරාධපුරය යන ආයතනයන්හි අණ හා පාලනය සිදුකරමින්, ඉහත පරිගණක ක්ෂේත්‍ර/මූලික වැඩපල වෙතින් යුධ හමුදාව වෙතින් නිකුත් කරන ලද තොරතුරු තාක්ෂණ උපකරණ/උපාංග අලුත්වැඩියා කටයුතු ඒකක බලප්‍රදේශය තුළ ප්‍රාදේශීය පාලගත කිරීම, සීසීටීවී කැමරා පද්ධති ස්ථාපිත කිරීම, එල්ඊඩී පුලුල් තිර සේවාව ලබාදීම ආදී ව්‍යාපෘති සිදුකරමින් මෙම ඒකකය රාජකාරී කරන ලදී.

ඉන්පසු මෙම ඒකකය ශ්‍රී ලංකා යුද්ධ හමුදා මුලස්ථානයේ සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ කාර්ය අවශ්‍යතාවය උදෙසා ක්‍රියාන්විත අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලද උපදෙස් මත 2023 මැයි මස 29 වන දින එවක ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩබ්ලිව්පීඩීඑන් අබේරත්න ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මගපෙන්වීම යටතේ යුද්ධ හමුදා මුලස්ථානයේ ස්ථානගත වන ලදී. ඉන්පසු මේ වන විට යුද්ධ හමුදා මුලස්ථානයේ ප්‍රධාන සංඥා නිළධාරී කාර්යාලය යටතේ 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය (යුහමු) වශයෙන් යුද්ධ හමුදා මුලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොට්ටේ යන ලිපිනයේ ස්ථානගතව රාජකාරී කටයුතු සිදුකරමින් සිටී.

යුද්ධ හමුදා මුලස්ථානයේ ස්ථාපනය කර ඇති දොරටු ආරක්ෂක පද්ධතිය, සීසීටීවී කැමරා පද්ධතිය, **IP TV** පද්ධතිය, **PABX** පරිගණක ජාල පද්ධතිය, ඩිජිටල් ඔරලෝසු පද්ධතිය වැනි පද්ධතීන් නිරීක්ෂණය, පාලනය සහ අලුත්වැඩියාවන්ද, ඩ්‍රෝන කැමරා සහය ලබාදීම, පරිගණක අලුත්වැඩියාව, අන්තර්ජාල/දුරකථන රැහැන් ඇදීම සහ අලුත්වැඩියාව, උත්සව සහ සම්මන්ත්‍රණ සඳහා පුලුල් තිර පද්ධති හා ශබ්ද විකාශණ යන්ත්‍ර/රූපවාහිනී යන්ත්‍ර සැපයීම, **Zoom** තාක්ෂණය ඔස්සේ පැවැත්වෙන සාකච්ඡා සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ සහය ලබාදීම වැනි රාජකාරීන් ආවරණය කිරීමට මෙම ඒකකය වෙත පැවරී ඇත.

මෙම ඒකකය ආරම්භ කර මේ දක්වා පැමිණි වසර 26 ක ගමන් මගෙහි සිදුවූ වෙනස්කම්හි සාර්ථකත්වයට දායක වෙමින් දිවිහිමියෙන් රාජකාරී කල සියලුම නිලධාරීන් හා සෙසු නිලයින්ද, දැනට රාජකාරියේ යෙදී සිටින සියලුම නිලධාරීන් හා සෙසු නිලයින්ද ඉතාමත් භක්ති ප්‍රණාම පූර්වකව සිහිපත් කරමින් මෙවන් මෙහෙවරක් ඉටුකල 6 වන සංඥා රෙජිමේන්තුවෙහි නාමය සමස්ථ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල කීර්තිමත් ඒකකයක් ලෙස දිනෙන් දින දියුණුවට පත් වේවායි ඉත සිතින් යුතුව ප්‍රාර්ථනා එක්කරමින් පසුගිය වසරේ අතීතාවර්ජනය මෙසේ සමාප්ත කරන්නෙමු.





2023 ජනවාරි මස 07 වන දින තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක බ්‍රිගේඩියර් පීඑල්එස්ඩබ්ලිව් ලියනගේ යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් ඒකකය යාපනය ප්‍රදේශයේ ස්ථානගතව සිටියදී සිදුකරන ලද ඒකක සංචාරය





2023 අප්‍රේල් මස 06 වන දින සංඥා බළසේනාධිපති කර්නල් එච්ඩීජේපී වීරතුංග ජ්‍යෙෂ්ඨ නිළධාරී විසින් ඒකකය යාපනය ප්‍රදේශයේ ස්ථානගතව සිටියදී සිදුකරන ලද ඒකක සංචාරය



2023 ජුනි මස 16 වන දින ඒකක 9 වන සංවත්සර දිනය නිමිත්තෙන් කොළඹ ගංගාරාම විහාරස්ථානයේදී පැවති බෝධි පූජාමය පිංකම



2023 සැප්තැම්බර් මස 18 වන දින අණදෙන නිලධාරී වශයෙන් මේජර් එම්සී ටුක්කාවඩු ජ්‍යෙෂ්ඨ නිලධාරී සුභ මොහොතින් රාජකාරි ආරම්භ කල අවස්ථාව



රණවිරු සම්පත් කේන්ද්‍රය වත්තල හි මාස 06 ක් පුරාවට පැවති පරිගණක පාඨමාලාවෙන් 6 ශ්‍රීලංසංබ ඒකකයට අයත් සෙ/287643 සංසෙ(කා) මැණිකේ යූඑල්එම්එස් ප්‍රථම ස්ථානය හිමිකර ගැනීමට සමත්ව ඇත



අම්පාර සටන් පුහුණු පාසලේදී සෙසුනිළයින් 167 කගේ සහභාගීත්වයෙන් පැවති ඉගැන්වීමේ ක්‍රමවේදය පාඨමාළාවේ 6 ශ්‍රීලංසංබ ඒකකයට අයත් සෙ/288363 සංසෙ(කා) සේනාරත්න එන්එන්පීඅයිඑස් ප්‍රථම ස්ථානය හිමිකර ගැනීමට සමත්ව ඇත

# 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය

යුද්ධ හමුදාවේ ව්‍යාප්තියත් සමග දශක 3 ක පමණ කාලයක් මුළුල්ලේ මාතෘ භූමියේ ස්වෛරීභාවය උදෙසා කුරිරු ත්‍රස්තවාදීන් හමුවේ සටන් වැදී සිටින පාබල බළඇණීන්ට ආධාරක බළඇණියක් වශයෙන් 7 වන රෙජිමේන්තු ශ්‍රී ලංකා සංඥා ආධාරක බලඇණිය 2008 පෙබරවාරි මස 08 වන දින සංඥා පවුලේ සාමාජිකයෙකු වශයෙන් නවතමයෙන් ශ්‍රී ලංකා සංඥා බළකායට එක් වන ලදී. මෙම ඒකකය වන්නි මානුෂීය මෙහෙයුම සඳහා සක්‍රිය ලෙසින් දායක වෙමින් නොච්චිකුලම්, පාලමොඩෙයි, කරුපඩ්ඩමුරිප්පු, උදයාර්කට්ටුකුලම්, විශ්වමඩු, ධර්මපුරම් ප්‍රදේශයන්හි ක්‍රියාන්විත සඳහා දායකත්වය ලබා දීමේදී රණවිරුවන් 18 ක් තම මාතෘ භූමිය වෙනුවෙන් දිවි පිදූ අතර, රණවිරුවන් 63 දෙනෙකු රණකෂිතයට පත්වන ලදී.

වන්නි මනුෂික මෙහෙයුම අවසන් වීමෙන් පසු 2013 මාර්තු මස 10 වන දින වෘත්තීය සංඥා රෙජිමේන්තුවක් වශයෙන් ආසේමු (මධ්‍යම) මූලික කොට ගෙන දියතලාව ප්‍රදේශයේ ස්ථාන ගත වීමෙන් පසු ආසේමු (බටහිර) හා ආසේමු (මධ්‍යම) බලප්‍රදේශයන්හි සංඥා රාජකාරි ඉටුකිරීමේ භාරදූර වගකීම භාර ගත් අතර. දිස්ත්‍රික්ක 15 ක් ආවරණය කරමින් වසරකට අධික කාලයක් මෙම ආසේමු බල ප්‍රදේශයන්හි පැවරෙන සංඥා රාජකාරි සාර්ථකව ඉටු කරන ලදී.

පසුව මෙම ඒකකය 2014 දෙසැම්බර් මස 26 වන දින සියළු නිලයින්ගේ අප්‍රතිහත කැපවීම මත ආසේමු (මධ්‍යම) යටතේ දියතලාව මැණික්කන්ද ප්‍රදේශයේ දර්ශණීය භූමි භාගයක් තුල ස්ථාපිත කර ඇති අතර, වර්තමානය වන විට ආසේමු (මධ්‍යම) බළප්‍රදේශයේ පිහිටි ආදර්ශ කඳවුර වශයෙන් පැසසුමට ලක්ව ඇති අතර, මධ්‍යම කදුකරයේ පිහිටි භූවිෂමතා නිසා සිදුවන අපහසුතායන් මගහරවා ගනිමින් දිස්ත්‍රික්ක 6 ක් ආවරණය වන පරිදි සංඥා රෙජිමේන්තුවක් වශයෙන් බලප්‍රදේශය තුල තොරතුරු සහ සන්නිවේදන තාකෂණය සපුරාලමින් මනාව රාජකාරි ඉටුකරනු ලබයි.



**මේජර් ඩීඑස්එල් කුමාරසිරි පීඑස්සී**
**අණදෙන නිලධාරි**

ගෙවීගිය වසරක කාලසීමාව තුල ඒකක අණදෙන නිලධාරිගේ මග පෙන්වීම යටතේ ඒකකයෙහි 15 වන සංවත්සර උත්සවය 2023 පෙබරවාරි මස 08 වන දින ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී. එමෙන්ම මෙම ඒකකයට අභිමානයක් එක්කරමින් ප්‍රධාන සංඥා නිලධාරී හා සංඥා බළකාධිපති, තොරතුරු තාකෂණ අධ්‍යකෂක හා සංඥා බළසේනාධිපති ඒකකයේ නිළ සංචාරයන් සිදු කල අතර, අවසන් වශයෙන් ඉතා කෙටි කාලයකදී සංඥා රෙජිමේන්තුවේ ඒකක අතුරින් අවස්ථා තුනකදී සංඥා බළකායේ හොඳම ඒකකය බවට පත්කිරීමට සහ මෙම ඒකකය ඉතාමත්ම කීර්තිමත් ඒකකයක් ලෙස ඔසවා තැබීමට අනගිභවනීය හා සෘජු එඩිතර නායකත්වයක් ලබාදුන් මෙම ඒකකයේ රාජකාරී කරන ලද සියළුම අණදෙන නිලධාරීවරුන් කෘතඥතාවයෙන් යුතුව සිහිපත් කරමි.





2022 ඔක්තෝබර් මස 29 වන දින ප්‍රධාන සංඥා නිලධාරි හා සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් එච්එම්එල්ඩී හේරත් ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ ඒකක සංචාරය





2023 අප්‍රේල් මස 28 වන දින ප්‍රධාන සංඥා නිලධාරි හා සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩියූ ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ ඒකක සංචාරය





2023 ජනවාරි මස 21 වන දින තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් පීඑල්එස්ඩබ්ලිව් ලියනගේ යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ ඒකක සංචාරය





2023.06.20 දින නව සංඥා බළසේනාධිපති කර්නල් එච්ඩීජේපී වීරතුංග ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ ඒකක සංචාරය









2023 පෙබරවාරි මස 08 වන දින ඒකක 15 වන සංවත්සරය පැවැත්වූ අතර, ඊට සමගාමීව මියගිය රණවිරුවන් පිං අනුමෝදන් කිරීම සඳහා සර්ව රාත්‍රික පිරිත් සජ්ජායනාවක් පැවැත්වූ අතර ඒකක අණදෙන නිලධාරි හට සම්මාන මුරයක්, සම්මාන පෙළපාලියක් හා සියළු නිල භෝජන සංග්‍රහයක් සහ සුහද ක්‍රීඩා තරග පවත්වන ලදී

# 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය

මානුෂීය මෙහෙයුමෙහි තීරණාත්මක සන්ධිස්ථානයන්හි පෙරමුණු ගනිමින් අධාරක බළඇණි ලෙස සංඥා බළකායේ රෙජිමේන්තු කිහිපයක්ම පාබල බලවේගයන්ට උත්ප්‍රේරණයක් සපයන අවධියක සංඥා සම්බන්ධතාවයන්හි අඛණ්ඩ පැවැත්ම උදෙසා සංඥා රෙජිමේන්තුවක අවශ්‍යතාවය සපුරාලමින් වර්ෂ 2008 ක් වු ජුලි මස 15 වන දින පනාගොඩ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය තුළ බිහිවු 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය වඩාත් ගුණාත්මක වු වෘත්තීය හමුදාවක භූමිකාව තහවුරු කර ගනිමින් විප්ලවීය වු ගමන් මගක නියැලෙමින් 4 වන ඊලාම් යුද්ධය පැවති සමයේ ත්‍රිවිධ හමුදාව මගින් දියත් කරන ලද වන්නි මානුෂීය මෙහෙයුමේ විශාල කාර්‍යභාරයක් ඉටු කළ 58 සේනාංකය වෙත සංඥා සම්බන්ධතාවය ලබාදීම උදෙසා 2008 අගෝස්තු මස 07 වන දින මන්නාරම තල්අඩි ප්‍රදේශයේ ස්ථානගත වු අතර, 58 පාබල සේනාංකය හා යටතේ පාලනය වු පාබල බලසේනා මෙන්ම පාබල ඒකකයන්හි සංඥා සම්බන්ධතා පිහිටුවාලීම සඳහා විශාල කාර්‍යභාරයක් ඉටු කරමින් 2009 පෙබරවාරි මස 5 වන දින පරන්තන් ප්‍රදේශයේද, 2009 අප්‍රේල් මස 25 දින කිලිනොච්චිය ප්‍රදේශයේ ඉරණමඩු මන්සංධියේ ස්ථාපනය කර ආරක්‍ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය) යටතේ 57, 65, 66 පාබල සේනාංක සහ යටතේ පාලනය වු පාබල බලසේනා මූලස්ථාන සහ පාබල ඒකකයන් සඳහා පුරා වසර 13 ක් සංඥා සම්බන්ධතාවය ලබා දෙන ලදී.

2021 ඔක්තෝබර් මස 17 වන දින ආරක්‍ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය), 1 බළකාය නමින් විශේෂිත වු රාජකාරීන් සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල නැවත ස්ථාපිත වූ අතර, 1 බළකායට සෘජුවම අනුබද්ධිත සංඥා ඒකකයක් ලෙස වර්තමානයේදී කිලිනොච්චි ප්‍රදේශයේ ස්ථානගතව ක්‍රියා කරනු ලබයි. ඒ අනුව දිවයිනම ආවරණය වන පරිදි ස්ථානගත 53, 58 පාබල සේනාංක මූලස්ථාන හා කමාන්ඩෝ බළසේනා මූලස්ථානය, විශේෂ බළකා බලසේනා මූලස්ථානය, ගුවන් සංක්‍රමික බළසේනා මූලස්ථානය හා ඒ යටතේ පාලනය වන සියළුම පාබල බළසේනා මූලස්ථාන මෙන්ම පාබල බළඇණි වෙත අඛණ්ඩව තොරතුරු තාක්‍ෂණික සහය ලබාදීම සහ සංඥා සම්බන්ධතාවයන් පවත්වා ගැනීම මෙන්ම යුද්ධ හමුදාධිපති විසින් ඉදුරාම 1 බළකාය වෙත ලබා දෙනු ලබන



**මේජර් කේඑම්අයිපී හේමපාල යුඑස්පී පීඑස්සී**
**අණදෙන නිලධාරී**

නියෝග/උපදෙස් ක්‍රියාත්ම කිරිම සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණය හා සංඥා සම්බන්ධතාවයන් ලබාදීම 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ මූලික රාජකාරීන් ලෙස සඳහන් කල හැක. යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරි හා සංඥා බළකාධිපතිගේ මගපෙන්විම යටතේ 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය නුදුරේදී විද්‍යුත් සංග්‍රාමික ඒකකයක් ලෙස ස්ථාපිත කිරීමට නියමිත සියලු කටයුතු සංවිධානය කර ඇත.

9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ අණදෙන නිලධාරි ලෙස මේජර් කේඑම්අයිපී හේමපාල යුඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි කටයුතු කරනු ලබන අතර, අණදෙන නිලධාරිගේ අණදීම හා මග පෙන්වීම යටතේ වඩාත් ගුණාත්මක වු වෘත්තීය හමුදාවක භූමිකාව තහවුරු කර ගැනීම සඳහා විප්ලවීය වු ගමන් මගක තවදුරටත් නියැලී සිටී.





යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරි සහ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් එච්එම්එල්ඩී හේරත් ආර්එස්පී ව්එස්ව් යුඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි 2023 පෙබරවාරි මස 12 වන දින නිල සංචාරයේ යෙදීම





යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරි සහ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් කේඑඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරි 2023 ජුනි මස 13 වන දින සිදුකරන ලද 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ නිල සංචාරය





සංඥා බළසේනාධිපති කර්නල් එච්ඩීජේපී වීරතුංග ජ්‍යෙෂ්ඨ නිළධාරි 2023 අගෝස්තු මස 05 වන දින 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ සිදු කරන ලද නිල සංචාරය









9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ 15 වන සංවත්සරය 2023 ජුලි මස 15 වන දින ඉතා උත්කර්ශවත් අන්දමින් සමරයි





2023 අගෝස්තු මස 21 වන දින අණදෙන නිලධාරි වශයෙන් මේජර් කේඑම්අයිපී හේමපාල යුඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙනුවෙන් පිරිනැමු සම්මාන මුරය හා සුභ මොහොතින් රාජකාරි ආරම්භ කල අවස්ථාව

# 10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය (සන්නිවේදන තාක්ෂණ)

10 වන රෙජිමේන්තුව ශ්‍රිලංකා සංඥා බළකායේ හත් වන අණදෙන නිළධාරී වශයෙන් මේජර් ටීටීඑන් මෙන්ඩිස් යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිළධාරී කටයුතු කරන අතර දෙවන අණදෙන නිළධාරී ලෙස මේජර් එම්සීඒ ඩයස් පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරී රාජකාරී සිදුකරනු ලබයි.



මේජර් ටීටීඑන් මෙන්ඩිස් යූඑස්පී
අණදෙන නිලධාරී

ආරම්භයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා යුධ හමුදාවේ සියලුම සන්නිවේදන හා තාක්ෂණික අවශ්‍යතාවයන් නොපිරි හෙලා ඉටුකරමින් මහගු සේවයක් සැපයු 10 වන ශ්‍රිලංකා සංඥා බළකාය (**CT**) මෙම වසරේදී යුද්ධ හමුදාව වෙත නවතමයෙන් මිලදී ගන්නා ලද නව ස්වයංක්‍රිය විනිමයන් යුධ හමුදා සංනිවේදන ජාලයට එක් කරන ලදී. තවද යුද්ධ හමුදා ක්‍ෂුද්‍ර තරංග ජාලය පුළුල් කිරීමේ කටයුතු සඳහා මෙම ඒකකය සෘජු දායකත්වයක් ලබා දී ඇත. එමෙන්ම මෙවර 75 වන නිදහස් දින උත්සවයට සමගාමීව පැවති නිදහස් දින පෙළපාලියෙහි ජන ඇමතුම් සේවාව මෙම ඒකකයේ නිලධාරීන් හා සෙසුනිලයින්ගේ කැපවීම හා උනන්දුව මත සාර්ථකව ඉටුකරනු ලැබු අතර, එම උත්සවය අවසානයේදී සංඥා බළකාය වෙතින් ලබාදුන් සේවය ඇගයීමට ලක් විය.





යුද්ධ හමුදාවේ පාලන කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා අනාරක්ෂිත සන්නිවේදන පද්ධතිවල අවශ්‍යතාවය සපුරාලමින් 10 වන ශ්‍රී ලංකා සංඥා බළකායේ භටපිරිස් විසින් එකලස් කරන ලද නව 'ෆ්ලෑෂ් කොම්' (**FLASH COM**) නම් ගුවන් විදුලි සන්නිවේදන යන්ත්‍රය 2023 ජනවාරි මස 05 දින ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් එච්එම්එල්ඩී හේරත් ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී විසින් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් විකුම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයු වෙත නිල වශයෙන් භාරදෙනු ලැබීය



විශේෂ අවස්ථාවන්හි ආරක්ෂක කටයුතු සඳහා **PRM** 4515 **COUGER REPEATER** භාවිතයෙන් නවඋත්පාදන ගුවන් විදුලි උපකරණ කට්ටලයක් මෙම ඒකක ගුවන් විදුලි බළඝණය විසින් සංස්කරණය කර 2022 ඔක්තෝබර් මස 17 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ පැවැත්වූ විශේෂ උත්සව අවස්ථාවේදී යුද්ධ හමුදාපති වෙත හදුන්වා දෙන ලදී



මෙම ඒකකයෙහි නව අණදෙන නිලධාරී වශයෙන් මේජර් ටීටීඑන් මෙන්ඩිස් යූඑස්පී ශ්‍රීලංසංබ ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් ඒකක 7 වන අණදෙන නිලධාරී ලෙස 2023 මාර්තු මස 29 වන දින නවතමයෙන් වැඩ භාරගැනීම





ඒකක 8 වන සංවත්සරයෙහි විශේෂ අවස්ථා



මීගොඩ සංහිඳ ළමා නිවාසයට දිවා ආහාරය සහ පොත්පත් ලිපි ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම



75 වන ජාතික නිදහස් දින උත්සවය සඳහා ජන ඇමතුම් සේවාව ලබා දෙමින්



ශ්‍රී ලංකා පොලිසීය වෙත සන්නිවේදන පුහුණු වැඩසටහන් පැවැත්වීම



රොබෝ තාක්ෂණ අංශයේ නිලධාරීන් හා සෙසුනිලයන් විසින් සුනාමි බලපෑමට ලක්වන පාසල් සඳහා සුනාමි ආපදා පෙර සූදානම් ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී



නාවික හමුදාව වෙතින් පවත්වාගෙන යනු ලබන බුද්ධි පාඨමාලාව 01/2022 හි සෙසුනිලයන් සහ උපදේශකයින්ගේ අධ්‍යාපන සංචාරයක් 2023 ජනවාරි මස 05 දින සිදු කෙරිණි



මෙම ඒකක කාර්මික සෙනීන් විසින් ඉසේබ බසේමුහි නව සංඥා කුලුණක් ස්ථාපනය කිරීම

## 11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය

11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ අටවන අණදෙන නිළධාරී වශයෙන් මේජර් කේඑම්පීපීර්ටීබී කැකුලන්දර ජ්‍යෙෂ්ඨ නිළධාරී කටයුතු කරනු ලබයි. දෙවන අණදෙන නිළධාරී වශයෙන් මේජර් ජේඑම්ඩීකේ මධුවන්ද යුඑස්පී ජ්‍යෙෂ්ඨ නිළධාරී රාජකාරි සිදුකරනු ලබයි. විධායක අධිකාරී ලෙස කපිතාන් එච්එම්කේපී හේරත් නිළධාරී කටයුතු කරනු ලබයි.



මේජර් කේඑම්පීපීර්ටීබී කැකුලන්දර
අණදෙන නිළධාරී

ශ්‍රී ලංකා සංඥා බළකා රෙජිමේන්තු නවීන තාක්ෂණික දියුණුවත් සමග වර්තමාන තාක්ෂණික අවශ්‍යතාවයට ගැලපෙන පරිදි ප්‍රතිව්‍යුහගත කිරීමට සමගාමීව මෙම ඒකක පරිගණක වැඩපළ වෙතින් සිදුකරන ලද පරිගණක උපකරණ/උපාංග අළුත්වැඩියාව සබැඳි සියළුම කාර්යයන් 2023 අප්‍රේල් මස 17 වන දින සිට 10 ශ්‍රීලංසංබ ඒකකය වෙත පවරා දෙන ලදී. එම ඒකකය යටතේ තිබූ ජන ඇමතුම් සේවා බළඝණය මෙම ඒකකය යටතේ පිහිටුවා ඇති ශ්‍රව්‍ය දෘෂ්‍ය ඉංජිනේරු බළඝණය වෙත ඇතුලත් කර ඇත. තොරතුරු තාක්ෂණ ඉංජිනේරු සේවාවන් සැපයීම වෙනුවෙන් තාක්ෂණික ඉංජිනේරු සේවා බළඝණය පිහිටුවා ඇති අතර, පහත දක්වා ඇති සේවාවන් දැනට ඉටු කරනු ලබයි.

- යුද්ධ හමුදාව තුල පරිඝණක ජාලකරණ ඉංජිනේරු සේවා සැපයීම.
- යුද්ධ හමුදාව තුල ආවේක්ෂණ උපකරණ හා ජාල සේවා/මැදිරි ස්ථාපනය.
- යුද්ධ හමුදාවට අවශ්‍ය මාර්ග ගත සේවා ස්ථාපනය.
- සියළුම තොරතුරු තාක්ෂණ පද්ධති හමුදාව තුල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් ස්ථාපනය/නඩත්තු කිරීම.
- යුද්ධ හමුදා දත්ත ජාලය රටපුරා ස්ථාවරව පවත්වා ගැනීමට අවශ්‍ය ඉංජිනේරු සේවා සැපයීම.

මෙම ඒකකය යටතේ පාලනය වන ශ්‍රව්‍ය දෘශ්‍ය සේවා බළඝණය මගින් 2022 හා 2023 වර්ෂයේදී සිදුකරන ලද විශේෂ උත්සව අවස්ථාවන්.

- 75 වන ජාතික නිදහස් දින සැමරුම් උත්සව පෙළපාලිය සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය සේවා සම්පාදනය කිරීම.

- 73 වන යුද්ධ හමුදා දින සැමරුම් උත්සව පෙළපාලිය සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය සේවා සම්පාදනය කිරීම.

මෙම ඒකකය වෙතින් 2022 වර්ෂයේදී සහ 2023 වර්ෂයේ අගෝස්තු මස දක්වා ශ්‍රව්‍ය දෘෂ්‍ය සේවා පහත සඳහන් පරිදි ලබා දී ඇත.

- ජාතික මට්ටමේ උත්සව අවස්ථා - 08
- යුද්ධ හමුදාධිපති සහභාගි වන උත්සව අවස්ථා - 40
- අනෙකුත් යුද්ධ හමුදා උත්සව - 110
- අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන උත්සව අවස්ථා - 45

මෙම ඒකකය වෙතින් 2022 වර්ෂයේ සිට 2023 වර්ෂයේ අගෝස්තු මස දක්වා සම්පූර්ණ කර ඇති මහා පරිමාණ තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති පහත සඳහන් පරිදි වේ.

- යුද්ධ හමුදා රෝහල - පල්ලේකැලේ හි **CCTV/IPTV** හා **LAN** ජාල පද්ධතීන් ස්ථාපනය කිරීම.
- සේවා වනිතා සුභසාධක ගොඩනැගිල්ල - මෙට්ලන්ඩ් පෙදෙසෙහි **CCTV/IPTV** හා **LAN** ජාල පද්ධතීන් ස්ථාපනය කිරීම.
- මහර හා මීගමුව බන්ධනාගාරයන්හී **CCTV** කැමරා පද්ධති ස්ථාපනය කිරීම.
- යුධෝපකරණ ගබඩා සංකීර්ණය - පුනානි හි **CCTV** කැමරා පද්ධති ස්ථාපනය කිරීම.





මෙම ඒකකයෙහි 8 වන අණදෙන නිලධාරී වශයෙන් මේජර් කේඑම්පීපීර්ටීබී කැකුලන්දර ශ්‍රීලංසංබ ජ්‍යෙෂ්ඨ නිලධාරී 2023 ඔක්තෝබර් මස 03 වන දින වැඩ භාරගැනීම





වත්මන් දෙවන අණදෙන නිළධාරී වශයෙන් මේජර් ජේඑම්ඩීකේ මධුවන්ද යූඑස්පී නිළධාරී 2023 අගෝස්තු මස 10 වන දින එම තනතුර භාරගත් අවස්ථාව

මෙම ඒකක ඊ බළඝණයේ නිළධාරී අණදෙන වශයෙන් මේජර් ජේඩීයූඑන් ජයසූරිය නිළධාරී 2023 ජුනි මස 26 වන දින එම තනතුර භාරගත් අවස්ථාව






75 වන ජාතික නිදහස් දින සැමරුම් උත්සව පෙළපාලිය සහ 2022 වර්ෂයේදී පැවති නත්තල් සැමරුම් උත්සවය සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය සේවා සම්පාදනය කිරීම





10 ශ්‍රීලංසංබ ඒකකය වෙතින් සේවාවන් සපයන ලද ජනඇමතුම් සේවාවන් සැපයීමේ බණ්ඩය මෙම ඒකක අණදෙන නිළධාරිගේ මග පෙන්වීම යටතේ සිදුකිරීම සඳහා 2023 ජුනි මස 06 වන දින මෙම ඒකකය වෙත පවරාදීම් සිදුකරන ලදී





පරිගණක ජාලගත කිරීම්, ඇස්තමේන්තු පත් සකස් කිරීම් සහ බිඳ වැටීම් ඇතුළු නඩත්තු සේවාවන් සැපයීම සහ සීසීටීවී කැමරා නවතමයෙන් සවි කිරීම, ඇස්තමේන්තු පත් සකස් කිරීම් අළුත්වැඩියාව සහ නඩත්තු සේවාවන් සැපයීම

## 12 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය (සයිබර් ආරක්ෂණ)

නූතන සයිබර් අභියෝගවලට සාර්ථකව මුහුණදීමේ පරමාර්ථය පෙරදැරි කරගෙන සංඥා බළකා මෑණියන්ගේ කුසින් මෙලොව එළිය දුටු 12 වන සංඥා රෙජිමේන්තුව (සයිබර් ආරක්ෂණ) මේ වන විට සිය සයවන වර්ෂ පූර්ණය සනිටුහන් කරනු ලබයි.

පස්වන අණදෙන නිලධාරී වශයෙන් 2023 අප්‍රේල් මස 18 වන දින ලුතිනන් කර්නල් ඩබ්ලිව්ආර්එම්ආර් වික්‍රමසිංහ යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී අභිනවයෙන් සිය රාජකාරී භාරගැනීම සිදු කරන ලද අතර, ඒ වෙනුවෙන් සම්මාන මුරයක්, සම්මාන පෙළපාලියක් ආගමික වතාවත් හා සියළු නිළ ඇමතීමක්ද සිදු කරන ලදී.

මේ වන විට නිලධාරීන් 09 ක් සහ සෙසුනිලයින් 203 ක් සමන්විත මෙම ඒකකයෙහි වත්මන් අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩබ්ලිව්ආර්එම්ආර් වික්‍රමසිංහ යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ නිසි නායකත්වය හා මඟපෙන්වීම යටතේ ඒකකයේ සියළුම අංශයන්හි ඉදිරි කටයුතු ඉතා උසස් අන්දමින් ඉටුකිරීමේ හැකියාව ලැබී ඇත. මෙම ඒකකයේ දෙවන අණදෙන නිලධාරී ලෙස මේජර් ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්ඩීඩබ්ලිව්කේඑම්ආර්එන්ඩීබී වැලිවිට එල්එස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරීද, විධායක අධිකාරී ලෙස කපිතාන් වීකේඑල් බණ්ඩාර නිලධාරී කටයුතු කරන අතර, රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් බනි 1 ඩීඑම්එස් දිසානායක බලලත් නිලධාරී රාජකාරී සිදු කරනු ලබයි.

තවද ඒකකය වෙත පැවරී ඇති කාර්යභාරය කාර්යක්ෂමව ඉටුකිරීම වෙනුවෙන් සයිබර් අණසක මෙහෙයුම් මධ්‍යස්ථානය (**Cyber Command Operation Center**), හදිසි ප්‍රතිචාරාත්මක බළඝණය (**Emergency Response Squadron**), සයිබර් ආරක්ෂණ බලඝණය (**Cyber Defensive Squadron**), සයිබර් විගණන බළඝණය (**Cyber Audit Squadron**), සයිබර් ප්‍රහාරාත්මක බලඝණය (**Cyber Offensive Squadron**) හා සයිබර් චෝහාරාත්මක විමර්ශණ බළඝණය (**Cyber Forensic Investigation Squadron**) බළඝණයන් ස්ථාපිත කර ඇත.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා දත්ත ජාලය, පරිගණක පද්ධතීන්ට හා වෙනත් තාක්‍ෂණික උපකරණ වෙත බාහිරෙන් එල්ලවිය හැකි විවිධාකාර තර්ජනයන් මැඩපැවැත්වීම සඳහා සුවිශේෂ දායකත්වයක් මෙම ඒකකය විසින් ලබා දෙනු ලබන අතර, ප්‍රධාන සංඥා නිලධාරී සහ තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්‍ෂකගේ මඟපෙන්වීම යටතේ මෙම ඒකක අණදෙන නිලධාරීගේ මෙහෙය වීම මත එම කාර්යයන් සාර්ථකව ඉටු කරනු ලබයි.

ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයෙහි වාර්ෂික පුහුණු සැලැස්මට සමගාමීව 2023 අප්‍රේල් මස 26 වන දින හා 2023 ජුනි මස 23 යන දෙදින පුරා පවත්වන ලද සයිබර් ආරක්ෂණ සබැඳි පුහුණු වැඩසටහන සඳහා මෙම ඒකකයෙහි ලුතිනන් එස්අයි වල්පිට නිලධාරී සහ ලුතිනන් ඩබ්ලිව්ඩීඑස් ඇනස්ටා නිලධාරිනිය විසින් විශේෂ දේශණයන් සිදුකරන ලදී. තවද 2023 අප්‍රේල් මස 24 වන දින සිට 2023 මැයි මස 22 වන දින දක්වා විශේෂ බළකායෙහි සේවයේ නියුතු නිලධාරී/සෙසුනිලයින්ගේ (01×20) සහභාගීත්වයෙන් සමාජ මාධ්‍ය හැසිරවීම සහ සයිබර් ආරක්ෂණ දැනුම ඉහල නැන්වීමේ අරමුණින් වැඩමුළුවක් සිදු කරන ලදී. ඊට



ලුතිනන් කර්නල් ඩබ්ලිව්ආර්එම්ආර් වික්‍රමසිංහ යූඑස්පී
අණදෙන නිලධාරී

අමතරව සියලුම රෙජිමේන්තු මධ්‍යස්ථාන/පුහුණු පාසල් ඉලක්ක කොට සමාජ මාධ්‍ය හැසිරවීම සහ සයිබර් ආරක්ෂණය පිළිබඳ පුහුණු දේශණයන් සිදු කරගෙන යන අතර, එය යුද්ධ හමුදාවේ අනාගත සයිබර් ආරක්ෂණ වැඩ පිළිවෙලට මහත් පිටුවහලක් වනු ඇත.

මෙම රෙජිමේන්තුවෙහි 6 වන සංවත්සරය 2023 ජනවාරි මස 25 වන දිනට යෙදී තිබූ අතර, අණදෙන නිලධාරී වෙත පිරිනමන ලද සම්මාන පෙළපාලියක් ලබාදීමෙන් අනතුරුව සියලු නිල දිවා භෝජන සංග්‍රහය පවත්වන ලදී. තවද ඒකක සංවත්සරය වෙනුවෙන් නිලධාරීන් සහ සෙසු නිළයින්ගේ සුභදතාවය වර්ධනය කිරීමේ අරමුණින් සියලු නිල සුභද හමුවක්ද පවත්වන ලදී.

පුරා වසර 1 මාස 3 ක් පමණ කාලයක් අණදෙන නිලධාරී ලෙස රාජකාරී ඉටුකරන ලද කර්නල් කේවීපී ධම්මික යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2023 අප්‍රේල් මස 17 වන දින එම තනතුරින් නික්ම යන ලද අතර, ඒ වෙනුවෙන් සම්ප්‍රදායානුකූලව සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනමන ලදී.

සංඥා බළකායේ නව සාමාජිකයෙකු වශයෙන් යුද්ධ හමුදාව, සයිබර් ආරක්ෂණය අතින් ඉහළට ඔසවා තැබීමේ මෙහෙවරට උරදෙමින් නවීන පරිගණක තාක්‍ෂණික දැනුමින් දීප්තිමත් ඉදිරි ගමනක් යාම ඒකකයේ අණදෙන නිලධාරී ඇතුළු සියලු නිලධාරීන්ගේ හා සෙසුනිලයින්ගේ ඒකායන අරමුණ වී ඇති අතර, මෙවන්වූ මෙහෙවරක් ඉටුකරනු ලබන 12 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ නාමය සංඥා බළකාය තුළ පමණක් නොව සමස්ථ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ ද දීප්තිමත් ඒකකයක් ලෙස වැජඹෙන්නට ප්‍රාර්ථනා එක් කරමින් පසුගිය වසරෙහි අතීතාවර්ජනය මෙසේ සමාප්ත කරන්නෙමු.





2023 අප්‍රේල් මස 18 වන දින මෙම ඒකකයේ 5 වන අණදෙන නිලධාරී වශයෙන් රාජකාරී ආරම්භ කරන ලද ලුතිනන් කර්නල් ඩබ්ලිව්ආර්එම්ආර් වික්‍රමසිංහ යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී සුභ මොහොතින් රාජකාරී ආරම්භ කිරීම



2023 ජනවාරි මස 25 වන දින මෙම ඒකකයේ 6 වන සංවත්සරය වෙනුවෙන් අණදෙන නිලධාරී කර්නල් කේවීපී ධම්මික යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙත පිරිනමන ලද සම්මාන මුරය



2023 මාර්තු මස 28 වන දින මෙම ඒකකයේ දෙවන අණදෙන නිලධාරී වශයෙන් මේජර් ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්ඊඩබ්ලිව්-කේඑම්ආර්එන්ඩීබී වැලිවිට එල්එස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී සුභ මොහොතින් වැඩ භාරගත් අවස්ථාව



යුද්ධ හමුදා මූලස්ථානයේ ස්ථාපිත සයිබර් අණසක මෙහෙයුම් මධ්‍යස්ථානයේ රාජකාරී සිදු කරන අවස්ථා



2023 අප්‍රේල් මස 24 වන දින සිට 2023 මැයි මස 22 වන දින දක්වා යුද්ධ හමුදා විශේෂ බළකායෙහි සේවයේ නියුතු නිලධාරී/සෙසු නිලයින්ගේ සමාජ මාධ්‍ය හැසිරවීම සහ සයිබර් ආරක්ෂණ දැනුම ඉහළ නැංවීමේ අරමුණින් පවත්වන ලද වැඩමුළුව

# 2 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය (ස්වේච්ඡා)

ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) - වැලිකන්ද කඳවුරු පරිශ්‍රයේ ස්ථානගතව සිටි මෙම ඒකකය ක්‍රියාඅම උපදෙස් පරිදි ඒකක ප්‍රතිස්ථානගත කිරීම යටතේ 2020 අගෝස්තු මස 15 වන දින 5 (සේවි) ශ්‍රීලයුකාබ ඒකකය ස්ථානගතව සිටි දළුකාන කඳවුරු භූමියේ ස්ථානගත වන ලදී.

ඒ අනුව දළුකාන කඳවුරු භූමියේ ස්ථානගත වීමෙන් අනතුරුව නිලධාරි/සෙසුනිලයින්ගේ ප්‍රමාණයට සරිලන පරිදි සනීපාරක්ෂක අවශ්‍යතාවයන් සඳහා අවැසි වැසිකිලි පද්ධති නවතමයෙන් ඉදිකිරීම, නිලධාරි නිවස්නය නවීකරණය කිරීම, බළලත් නිලධාරි සහ සැරයන් නිවස්නය නවීකරණය කිරීම, කොනොනි සමාජශාලාව අළුත්වැඩියා කිරීම සහ නේවාසික පහසුකම් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම වැනි සංවර්ධන කාර්‍යයන් ආරම්භ කරන ලදී. එමෙන්ම නවතමයෙන් සරඹ භූමියක් ඉදිකිරීම සහ සම්මාන මුර පීඨිකාවක් ඉදිකිරීම ඒ අතර, ප්‍රමුඛත්වයක් ගනී.

තවද, කඳවුරු භූමියේ ඇති මංමාවත් සංවර්ධනය කිරීම, කඳවුරේ අලංකාරය වෙනුවෙන් ප්‍රධාන දොරටුව අසල සෙබළ මූර්තියක් ඉදිකිරීම, සුභසාධක වෙළඳසැල වැඩිදියුණු කිරීම මෙන්ම ඒකකයේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් නර්ථන, ජායාරූප සහ ගොවිපල ගිණුම් නවතමයෙන් ආරම්භ කරන ලදී.

මෙම ඒකක නිලධාරි සහ සෙසුනිලයින්ගේ යහපත් ශරීර සෞඛ්‍ය නංවාලීම සඳහා අංග සම්පූර්ණ ශරීර සුවතා මධ්‍යස්ථානයක් ඉදිකිරීමට කටයුතු කල අතර, ප්‍රායෝගික පුහුණු කටයුතු තුළින් සංඥා දැනුම වර්ධනය කිරීම සඳහා අඩුපාඩුවක්ව පැවති සංඥා විද්‍යාගාරයක් නවතමයෙන් ස්ථාපනය කිරීමට කටයුතු කරන ලදී.

එසේම 2023 වර්ෂයේ පැවති අන්තර් සංඥා ඒකක සරඹ තරගාවලියේදී දක්ෂතම කණ්ඩභාර නිලධාරී සහ දක්ෂතම සරඹ කණ්ඩායමට හිමි සම්මාන දිනාගනිමින් 2023 වසරේ සියළු සංඥා ඒකක අභිබවා සරඹ තරගාවලියේ ශූරතාවය දිනාගන්නා ලද අතර, අන්තර් සංඥා ඒකක ක්‍රීඩා තරගාවලියේ මෙතෙක් පැවති තරග අතුරින් අනෙකුත් සංඥා ඒකක අභිබවා සවි එසවීම, කාය වර්ධන, මේස පන්දු, කඹ ඇදීම, ටෙනිස්, කැරම් සහ එල්ලේ තරග වලින් ප්‍රථම ස්ථානය දිනා ගැනීමට මෙම ඒකක නිලධාරී සහ සෙසුනිළයින් හට හැකියාව ලැබී ඇත.

එමෙන්ම සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ මූල්‍ය අනුග්‍රහය යටතේ 2 (සේවි) ශ්‍රීලංසංබ ඒකකයට අයත් සෙ/2සී00761 ලා/කෝ මොහොට්ටි එම්එම්ආර්එම්කේ ආර්එස්පී (ආබාධිත) කොනොනි සහ ඔහුගේ පවුලේ සාමපිකයින් වෙනුවෙන් ඒකක අණදෙන නිලධාරිගේ



**මේජර් කේවීඑ් කොඩිකාර පීඑස්සී**
**අණදෙන නිලධාරී**

පූර්ණ අධීක්ෂණය යටතේ සියළු නිලධාරී සහ සෙසුනිළයින්ගේ පූර්ණ ශ්‍රම දායකත්වයෙන් නව නිවසක් උසස් අන්දමින් ඉදිකර එම කොනොනි අතුළු පවුලේ සාමාජිකයින් වෙත භාරදීමට කටයුතු කරන ලදී.

ඒ අනුව, පසුගිය කාලවකවානුව දෙස ආපසු හැරී බැලීමේදී මෙම ඒකකයට සීඝ්‍ර දියුණුවක් ලබාගැනීමේ හැකියාව ලැබී ඇති අතර, ඒ සඳහා මින් පෙර රාජකාරී කරන ලද අණදෙන නිලධාරීන්ගේ මගපෙන්වීම සහ ඒකකයේ සියළු නිලධාරී/සෙසුනිලයින්ගේ කැපවීම සහ දායකත්වය මේ අවස්ථාවේ කෘතවේදීව සිහිපත් කල යුතුය.

යුද්ධ හමුදාව ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්ම යටතේ 2023 මැයි මස 29 වන දින මෙම ඒකකය දළුකාන කඳවුරු පරිශ්‍රයේ සිට විසුරුවා හරින ලද 5(සේවි) ශ්‍රීලයුකාබ ස්ථානගතව සිටි ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) කඳවුරු පරිශ්‍රයේ නැවත ස්ථානගත වන ලදී.

ඒ අනුව, වත්මන් අණදෙන නිලධාරිගේ මගපෙන්වීම යටතේ ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) බලප්‍රදේශයේ සංඥා සහ තොරතුරු තාක්ෂණ රාජකාරීන් නිසි අයුරින් ඉටු කිරීම, නවීන තාක්ෂණික ක්‍රමවේදයන්ට අනුගත බහුකාර්ය සෙබළුන් නිර්මාණය කිරීම සහ අනෙකුත් ඒකකයන් වෙතද අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදෙමින් කටයුතු කරන මෙම ඒකකය ශ්‍රී ලංකා සංඥා බළකායේ මෙන්ම යුද්ධ හමුදාවේ දීප්තිමත් ඒකකයක් ලෙස දියුණුවට පත්වේවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරමු.





ශ්‍රී ලංකා සංඥා බළසේනාධිපති කර්නල් එච්ඩීජේපී වීරතුංග ජ්‍යෙෂ්ඨ නිලධාරි 2023 අප්‍රේල් මස 04 වන දින මෙම ඒකක සංචාරය



සංඥා බළකා මඩ්‍යස්ථාන සේනාවිධායක කර්නල් ඒකේඞී අධිකාරි ජ්‍යෂ්ඨ නිලධාරිගේ 2023 මැයි මස 01 වන දින මෙම ඒකක සංචාරය




2023.08.05 වන දින මෙම ඒකකයෙහි 14 වන දෙවන අණදෙන නිලධාරි වශයෙන් මේජර් ඩබ්එච්එස් සොයිසා පීඑස්සී ශ්‍රීලංසංබ ජ්‍යෂ්ඨ නිලධාරි වැඩ භාරගැනීම





2 (සෙව්) ශ්‍රී ලංකා සංඥා බළකායේ 43 වන සංවත්සරය අණදෙන නිලධාරි මේජර් කේවීජේ කොඩිකාර පීඑස්සී ජ්‍යෂ්ඨ නිලධාරීගේ ප්‍රධානත්වයෙන් ඒකකයට අයත් විවිධ ස්ථානයන්හි රාජකාරි කරනු ලබන ජ්‍යෂ්ඨ නිලධාරී/නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ සහභාගිත්වයෙන් යුතුව 2023 අප්‍රේල් මස 25 වන දින  දළුකාන කදවුරු පරිශ්‍රයේදි සමරන ලදි



2023 සැප්තැම්බර් මස 07 වන දින ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ටීකේආර් සිල්වා කේඑස්පී යන ජ්‍යෂ්ඨ නිලධාරිගේ මෙම ඒකක සංචාරය



ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ මුල්‍ය දායකත්වයෙන් හා 2 (සෙව්) ශ්‍රීලංසංබ ඒකකයේ ශ්‍රම දායකත්වයෙන් ලා/කෝප්‍රල් මොහොට්ටි එම්එම්ආර්එම්කේ ආර්එස්පී (ආබාධිත) කොනොනි හට නවතමයෙන් ඉදිකරන ලද නිවස සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනියගේ සුරතින් 2023 පෙබරවාරි මස 27 වන දින පිරිනමන ලදී



දළුකාන කදවුරු පරිශ්‍රයේ ස්ථානගතව සිටි මෙම ඒකකය යුද්ධ හමුදා ප්‍රතිව්‍යුහගථකරණ සැලැස්මට අනුව ක්‍රියාඅම උපදෙස් මත 2023 මැයි මස 29 වන දින විසුරුවාහරින ලද 5(සෙව්) ශ්‍රීලයුකාබ ස්ථානගතව සිටි ආරකෂක සේනා මුලස්ථානය (නැගෙනහිර) වැලිකන්ද කදවුරු පරිශ්‍රයේදී නැවතත් ප්‍රථිස්ථානගත විය

# විද්‍යුත් සංග්‍රාමික බළඝණය

1990 ජුලි මස 08 වන දින ආරම්භ කරන ලද විද්‍යුත් සංග්‍රාමික බළඝණය මේ වන විට අවුරුදු 33 ක දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියනු ලබයි. මෙම බළඝණය මගින් සංඥා ඒකකයන්හි සෙබලුන් හට සතුරා නොමග යැවීම හා බාධා කිරීම/සවන්දීම/දිශා සොයාගැනීමේ/භූමි නිරීක්ෂණ යන්ත්‍ර පිළිබඳ න්‍යායික හා ප්‍රයෝගික දැනුම වර්ධනය කිරීමේ අරමුණින් අදියර **III** ක් යටතේ 2023 පෙබරවාරි මස 09 වන දින සිට 2023 ජනවාරි මස 23 වන දින දක්වා සෙනීන් 12 දෙනෙකු සහ අදියර **IV** ක් යටතේ 2023 මැයි මස 10 වන දින සිට 2023 මැයි මස 26 වන දින දක්වා සෙනීන් 19 දෙනෙකු සංඥා රෙජිමේන්තු පරිශ්‍රයේ දී විද්‍යුත් සංග්‍රාමික පාඨමාලාවන් සාර්ථකව නිමකරන ලදී.

තවද, මෙම බළඝණය නව ඒකකයක් ලෙස ප්‍රතිස්ථාපනය කිරීමේ අරමුණින් යුතුව ප්‍රධාන සංඥා නිළධාරීගේ සහ සංඥා බලසේනාධිපතිගේ උපදෙස් මත 2023 අගෝස්තු මස 08 වන දින විද්‍යුත් සංග්‍රාමික වැඩමුළුව ආරම්භ කරන ලදී.













විද්‍යුත් සංග්‍රාමික වැඩමුළුවෙහි න්‍යායික හා ප්‍රයෝගික දැනුම වර්ධනය කිරීමේ අවස්ථා

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා සංගමය

වර්ෂ 1955 දෙසැම්බර් මස 15 දින සාමාජිකයින් 25 දෙනෙකුගෙන් ආරම්භ කරන ලද යුද්ධ හමුදා සංඥා සංගමය මේ වන විට වසර 68 ක අභිමානවත් අතීතයකට උරුමකම් කියනු ලැබේ. ආරම්භයේදී 25 දෙනෙකු පමණ වු සාමාජිකයින් සංඛ්‍යාව 2023 වර්ෂය වන විට සාමාජිකයින් 2700 ක ප්‍රමාණය දක්වා වර්ධනය කර ගනිමින් සංඥා සංගමයේ සාමාජිකයින් හට සුභසාධන කටයුතු විධිමත් අයුරින් සිදුකරනු ලැබේ.

මෙම සංගමයේ 68 වන මහා සභා රැස්වීම 2024 වර්ෂයට යෙදී තිබෙන අතර, 2023 වර්ෂය තුල ලේකම් ධුරයේ රාජකාරී කල සෙ/65581 බනි 11 පෙරේරා පීඑල්ටී කොමිෂන් නොලත් නිලධාරි 2023 මැයි මස 19 වන දින මියයාම හේතුවෙන් 2023 ජුනි මස 10 වන දින විධායක කමිටුව විසින් සෙ/65921 බනි 1 එච්ඒ ජයලත් කොමිෂන් නොලත් නිලධාරි පත්කර ගන්නා ලදී. තවද මෙම වර්ෂය තුල අප සංගමයෙහි උන්නතිය උදෙසා ඉමහත් කැපකිරීම් සිදුකල විශ්‍රාමික නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන් සහ සාමාජික මහතුන් 10 දෙනෙකු පමණ අප අතරින් සමුගත් බව ඉතා සංවේගයෙන් යුතුව සිහිපත් කරමු.



ගරු සභාපති
මේජර් ජෙනරාල් කේආර්පී රොවෙල් (විශ්‍රාමික)
ආර්ඩබ්ලිව්පී වීඑස්වී යුඑස්පී එන්ඩීයු යුඑස්ඒසීපීඑස්සී



මරණාධාර සංගමයේ සභාපති හා සංඥා සංගමයේ
උප සභාපති
කපිතන් ජේආර් මෙන්ඩිස් (විශ්‍රාමික)



ගරු ලේකම්
බනි 1 එච්ඒ ජයලත් (විශ්‍රාමික)



භාණ්ඩාගාරික
ලුතිතන් ඩබ්ලිව්එන්එස් වීරකෝන් (විශ්‍රාමික)

ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා සංගමයේ 2022 සහ 2023 වර්ෂය සදහා පත්කරන ලද
නව නිලධාරී මණ්ඩලය





ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ හිටපු සභාපති බ්‍රිගේඩියර් කේඒ ඥාණවීර (විශ්‍රාමික) යුඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින්
මහනුවර ශාඛාවේ සුහද හමුව ඇමතීම සහ එහි සමුහ ඡායාරූපය

## සේවා වනිතා ශාඛාව විසින් නත්තල් කැරොල් ගී ප්‍රසංගය සංවිධානය කර පවත්වන ලදී

2022 දෙසැම්බර් මාසය එළඹීමත් සමගම, සංඥා බළකා සේවා වනිතා ශාඛාව විසින් 2022 දෙසැම්බර් 23 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේදී නත්තල් කැරොල් ගී ප්‍රසංගයක් පැවැත්වීමට කටයුතු කරන ලදී. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි සෂිකා හේරත් මහත්මිය සහභාගි විය. නත්තල් කැරොල් ගීත අතරතුර නත්තල් සීයා විසින් එම ස්ථානයේ සිටි දරුවන්ට ත්‍යාග සහ රසකැවිලි ප්‍රදානය කරන ලදී.





## සේවා වනිතා ශාඛාව විසින් 2023 නව වසරට ආශිර්වාද පතා අධිෂ්ඨාන පූජාව සංවිධානය කරයි

ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාව මගින් 2023 ජනවාරි මස 07 වන දින පූජනීය කැළණිය රජමහා විහාරස්ථානයේදී බෝධි පූජා පිංකමක් පවත්වන ලදී. 2023 නව වසර උදාව වෙනුවෙන් හා එළඹෙන උසස් පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙත ආශිර්වාද කිරීමේ අරමුණින් මෙය සංවිධානය කරන ලදී. මෙම ආගමික වතාවත් සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන සංඥා නිලධාරී සහ ශ්‍රී ලංකා සංඥා බළකායේ බළකාධිපති මේජර් ජෙනරාල් එච්එම්එල්ඩී හේරත් ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී සහ ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනී සෂිකා හේරත් මහත්මිය සහභාගී විය.





## ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාව විසින් සංවිධානය කරන ලද ලේ දන්දීමේ වැඩසටහන

ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාව විසින් අපේක්ෂා රෝහල සමග එක්ව ලේ දන්දීමේ වැඩසටහනයක් 2023 පෙබරවාරි 8 වන දින ශ්‍රී ලංකා සංඥා බළකා රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. මෙම වැඩසටහන ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි සෂිකා හේරත් මහත්මියගේ සංකල්පයක් මත සිදුකරන ලදී. 100 දෙනෙකුට අධික යුද්ධ හමුදා සාමාජිකයින් පිරිසක් මෙහිදී ලේ පරිත්‍යාග කිරීමේ අවස්ථාවට දායක වූ අතර, මහරගම අපේක්ෂා රෝහලේ රුධිර බැංකුවේ වෛද්‍ය කණ්ඩායම මෙම අවස්ථාව සාර්ථක කර ගැනීමට දායක වූහ..





## විරූ නිසට සංඥා සේවා වනිතාවන්ගෙන් සෙවනක්

2 වන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා සංඥා බළකායට අයත්, ස්නායු ආබාධයකට ලක්ව මේ වන විට සක්‍රිය සේවයේ යෙදී සිටින ලා/කෝ මොහොට්ටි එම්එම්ආර්එම්කේ ආර්එස්පී කොනොනි හට දිර්ඝකාලයක සිට පවතින අවශ්‍යතාවයක් සපුරාලමින් ඔහු හට නව නිවසක් ඉදිකර භාරදීම ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනියගේ සුරතින් සිදුවිය. මෙම නිවස ඉදිකිරීම සඳහා ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය, සංඥා බළකා සේවා වනිතා ශාඛාව සහ 2 වන (ස්වේච්ඡා) රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය විසින් අවශ්‍ය මූල්‍ය දායකත්වය ලබාදී ඇත. වර්ෂ 2023 ක් වූ පෙබරවාරි මස 27 වන සඳුදා දිනට යෙදුනු සුභ මොහොතින් මෙම නව නිවස නිවැසියන් වෙත ඉතා චාම් උත්සවයකින් භාරදුන් අතර, මෙම නව නිවස ඉදිකිරීම 2 වන (ස්වේච්ඡා) රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ අණදෙන නිලධාරී මේජර් අසංක කොඩිකාර පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මෙහෙයවීම යටතේ ඒකක සෙබළුන්ගේ පූර්ණ ශ්‍රම දායකත්වයෙන් සිදුකරන ලදී.





## සේවා වනිතා ශාඛාවේ හිටපු සභාපතිනිය හට සමුදීම

ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් විසින් 2023 මාර්තු මස 11 වන දින ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය ලෙස කටයුතු කර තම ධුරයෙන් නික්ම යන සෂිකා හේරත් මහත්මිය වෙත රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරී නිවස්නයේ දී සමුගැනීමේ උත්සවයක් සංවිධානය කරන ලදී. අභිනව ගරු සභාපතිනිය ලෙස රාජකාරි ආරම්භ කල නාලනි රත්නායක මහත්මිය විසින් පිළිගැනීමේ කථාව පවත්වමින් තුවාල ලැබූ, මියගිය, සේවයේ යෙදී සිටින රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුබසාධනය නගා සිටුවීම උදෙසා හිටපු ගරු සභාපතිනිය වන සෂිකා හේරත් මහත්මිය කරන ලද අමිල මෙහෙවර ඉතා පැසසුමට ලක් කරමින් සභාව අමතන ලදී. ඉන් අනතුරුව සභාපතීත්වයෙන් සමුගත්තා ලද හිටපු සභාපතිනිය සාමාජිකාවන් අමතමින් නව සභාපතිනිය සහ සාමාජිකාවන්ට සමුගැනීමේ සාදය වෙනුවෙන් සිය කෘතඥතාව පළ කළ අතර, ඇය සභාපතිනිය ලෙස කටයුතු කළ කාලය තුළ සියළුම සාමාජිකාවන්ගෙන් ලැබුනු දිරිගැන්වීම් සිහිපත් කළාය.





## සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය වැඩ භාර ගැනීම

ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස නාලනි රත්නායක මහත්මිය 2023 මාර්තු 11 වන දින සංඥා බළකා සේවා වනිතා කාර්යාලය - පනාගොඩ හිදී වැඩ භාර ගන්නා ලදී. ධුරයට පත්වීමෙන් පසු 2023 මාර්තු මස මාසික සභා රැස්වීමද සේවා වනිතා කාර්යාලයේදී පවත්වන ලදී. නව සභාපතිනිය විසින් සිය මංගල දේශනයේදී සංඥා බළකායට අයත් සාමාජිකයින්ගේ පවුල් වල රැකියා විරහිත හා ජීවන තත්වය නගාසිටුවීමට පිළිසරණක් අවැසි සාමාජිකයින් සඳහා සුබසාධන වැඩසටහන් සිදු කිරීමට අදහස් කරන බව අවධාරණය කළාය.





## සේවා වනිතා ශාඛාව විසින් ගෙවතු වගාව සහ ඉවුම් පිහුම් වැඩමුළුවක් සංවිධානය කරන ලදී

ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව, ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාව විසින් සංවිධානය කරන ලද ගෙවතු වගා සහ ඉවුම් පිහුම් වැඩමුළුව 2023 මාර්තු 21 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේදී ගරු සභාපතිනි නාලිනී රත්නායක මහත්මියගේ උපදෙස් හා මගපෙන්වීම මත පවත්වන ලදී. බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මෙම උත්සවයේ සම්පත් දායකයින් ලෙස කටයුතු කරන ලදී. ශ්‍රී ලංකා සංඥා බළකායට අයත්  රැකියා විරහිත කලත්‍රයන් 100 කට වැඩි පිරිසකට ස්වයං රැකියා තුළින් ඔවුන්ගේ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කර ගැනීමට මෙහිදි අවස්ථාව උදාවන ලදි. මෙම වැඩමුළුවට පැමිණීමට නොහැකි වු පවුල්වල සාමාජිකයන් හට **ZOOM** තාක්ෂණය හරහා වැඩමුළුව පිළිබදව දැනුවත් වීමට පහසුකම් සලසන ලදී.









## සේවා වනිතා ශාඛාව විසින් සංවිධානය කරන ලද සිංහල සහ දෙමළ අලුත් අවුරුදු පොළ - 2023

2023 වර්ෂයේ සිංහල සහ දෙමළ අලුත් අවුරුදු උත්සවය නිමිත්තෙන් ශ්‍රී ලංකා සංඥා බළකායේ සේවා වනිතා ශාඛාව විසින් සංවිධානය කරන ලද වෙළඳ ප්‍රදර්ශනයක් 2023 අප්‍රේල් 11 වන දින පනාගොඩ, ශ්‍රී ලංකා සංඥා බළකායේ රෙජිමේන්තු මූලස්ථාන ක්‍රීඩා පිටියේදී පවත්වන ලදී. සංඥා බළකායෙහි රෙජිමේන්තු මධ්‍යස්ථානය, සියලුම ඒකකයන්, සංඥා පුහුණු පාසල සහ සංඥා බළකා සේවා වනිතා ශාඛාව විසින් පනාගොඩ, යුද්ධ හමුදා ජනපදයෙහි සේවය කරනු ලබන නිලධාරීන් සහ සෙසු නිලයින් සඳහා සිංහල සහ දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් සහනදායී මිලට පාරිභෝජන අවශ්‍යතා සැපයීම වෙනුවෙන් ආහාර ද්‍රව්‍ය, ඇඳුම් පැළඳුම් සහ තවත් බොහෝ ගෘහාශ්‍රිත ද්‍රව්‍ය අලෙවියට තබන ලදී. මෙම අවස්ථාව සඳහා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි නාලනී රත්නායක මහත්මිය සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන සංඥා නිලධාරි සහ ශ්‍රී ලංකා සංඥා බළකායේ බළකාධිපති මේජර් ජෙනරාල් කේඑඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු සහභාගි විය.









## වෙසක් පොහොය නිමිති කර ගනිමින් පැවැත්වූ ධර්ම දේශනය

2023 වෙසක් පුර පසලොස්වක පොහොය දිනය නිමිත්තෙන් ආශිර්වාද පතා පනාගොඩ බෝධිරාජාරාම විහාරස්ථානයේදී ආශිර්වාද ධර්ම දේශනයක් සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි නාලිනි රත්නායක මැතිනියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වින. මෙම අවස්ථාවට සංඥා බළකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්/නිලධාරීන් සහ සේවා වනිතා ශාඛාවේ සාමාජිකයින් ද සහභාගී විය.





## ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාව විසින් පොසොන් දිනය වෙනුවෙන් සංවිධානය කරන ලද සව් දන්සල

පොසොන් පුර පසළොස්වක පොහොය දිනය නිමිත්තෙන් ශ්‍රී ලංකා සංඥා බළකායේ සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් විසින් මහනුවර ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රය අසලදී "සව් දන්සැලක්" සංවිධානය කරන ලදී. එම දන්සැල 2023 ජුනි 03 වන දින ශ්‍රී ලංකා සංඥා බළකායේ බළකාධිපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු, ජ්‍යෙෂ්ඨ නිලධාරී හා ශ්‍රී ලංකා සංඥා බළකායේ සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි නාලනී රත්නායක මැතිණියද, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්/නිලධාරීන් සහ සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් ද සහභාගී විය.




## ඇසල පොහොය නිමිත්තෙන් සංවිධානය කරන ලද කිරි තේ දන්සැල

ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි නාලිනී රත්නායක මැතිණියගේ සංකල්පයකට අනුව ඇසල පොහොය නිමිති කර ගනිමින් 2023 ජුලි මස 03 වන දින පනාගොඩ බෝධිරාජාරාම විහාරස්ථානය අසලදී කිරි තේ දන්සැලක් පවත්වන ලදි. මෙම අවස්ථාවට සංඥා බළකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්/නිලධාරීන් සහ සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් ද සහභාගී විය.




## ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ මෑතකදි විශ්‍රාම ගිය ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ භාර්යාවන් හට සමුදීමේ සාදය

ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ මෑතකදි සමුදුන් සාමාජිකාවන් තිදෙනෙකු වන වාසුලා ගුණසේකර මහත්මිය, දිලීපා ප්‍රේමදාස මහත්මිය සහ නිර්මා තිලකරත්න මහත්මිය වෙත සමුදීමේ උත්සවයක් 2023 ජුලි මස 22 වන දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරී නිවස්නයේදී පවත්වන ලදී. සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය විසින් පිලිගැනීමේ කථාව සිදුකරමින් ඔවුන් විසින් සංඥා බළකා සේවා වනිතා ශාඛාව වෙනුවෙන් දක්වන ලද දායකත්වය අගය කරන ලදී.




# විශ්‍රාම ගැනීම් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්

## සංඥා බළකාධිපති හා ප්‍රධාන සංඥා නිලධාරි පත්වීම හෙබ වූ මේජර් ජෙනරාල් එච්එම්එල්ඩී හේරත් (විශ්‍රාමික) ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී

ශ්‍රී ලංකා සංඥා බළකායේ 16 වන බළකාධිපති ලෙස රාජකාරී ඉටුකල මේජර් ජෙනරාල් එච්එම්එල්ඩී හේරත් (විශ්‍රාමික) ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි වසර 34 ක ආදර්ශමත් සේවා කාලයකින් පසුව 2023 මාර්තු මස 02 වන දින යුද්ධ හමුදා සේවයෙන් විශ්‍රාම යන ලදී. තත් ජ්‍යෙෂ්ඨ නිලධාරි රෙජිමේන්තු මධ්‍යස්ථාන ප්‍රධාන දොරටුව අසලදී මධ්‍යස්ථාන සේනාවිධායක විසින් පිළිගැනීමෙන් පසු කඳවුරු මුරයක් පිරිනමන ලදී. ඉන් අනතුරුව එම ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් මියගිය රණවිරුවන් සිහිකරමින් මෙම රෙජිමේන්තු මධ්‍යස්ථාන රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දක්වන ලදී. පසුව එම ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙනුවෙන් සම්මාන මුරයක් පවත්වන ලද අතර විශ්‍රාම ගැනීම වෙනුවෙන් බලලත් නිලධාරි සහ සැරයන් නිවස්නය වෙතින් තේපැන් සංග්‍රහයක් පවත්වන ලදී. ඉන් පසුව සෙසුනිල භෝජනාගාරය තුළ සියළු නිලයින් වෙනුවෙන් දිවා භෝජන සංග්‍රහයක් පවත්වන ලද අතර, එහිදී එම ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් අතීතය  ආවර්ජනය කරමින් සියළු නිලයින් අමතන ලදී. අනතුරුව රෙජිමේන්තු මධ්‍යස්ථාන කාර්යාලය ඉදිරිපිට සිට ප්‍රධාන දොරටුව දක්වා සියළුම නිලධාරීන් සහ සෙසුනිලයින් විසින් නික්ම යන බළකාධිපති වෙනුවෙන් වීථි රේඛා ආචාරය  දැක්වීමට කටයුතු කරන ලදී. පසුව නික්ම යන බළකාධිපති ප්‍රධාන දොරටුව අසලදී සංඥා බළකා කඳවුර වෙත ආචාර කර කඳවුරු පරිශ්‍රයෙන් නික්ම යන ලදී. අවසාන වශයෙන් එදිනම රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරි නිවස්නයේදී නව ප්‍රධාන සංඥා නිළධාරි හා විශ්‍රාමික සංඥා බළකාධිපති හා ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් රාත්‍රී භෝජන සංග්‍රහයක් පවත්වන ලදී.













## බ්‍රිගේඩියර් පීජීජේ ගුණසේකර යූඑස්පී

ශ්‍රී ලංකා සංඥා බළකායට අයත් බ්‍රිගේඩියර් පීජීජේ ගුණසේකර යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි යුද්ධ හමුදාවෙන් 2023 මැයි මස 25 වන දින විශ්‍රාම ගිය අතර, ඊට සමගාමීව රෙජිමේන්තු මධ්‍යස්ථාන ප්‍රධාන දොරටුව අසලදී මධ්‍යස්ථාන සේනාවිධායක විසින් තත් ජ්‍යෙෂ්ඨ නිලධාරි පිළිගැනීමෙන් පසු කඳවුරු මුරයක් පිරිනමන ලදී. ඉන් අනතුරුව තත් ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් මියගිය රණවිරුවන් සිහිකරමින් මෙම රෙජිමේන්තු මධ්‍යස්ථාන රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දක්වන ලදී. පසුව තත් ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙනුවෙන් සම්මාන මුරයක් පවත්වන ලදී.









# සංඥා බළකායේ විශේෂ අවස්ථාවන්

## ශ්‍රී ලංකා සංඥා බළකා තල කැරලි ව්‍යාපෘතිය

සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත අරමුදල් රැස්කිරීමේ ප්‍රයත්නයක් වශයෙන් ශ්‍රී ලංකා සංඥා බළකාය විසින් නව "තල කැරලි" නිෂ්පාදන ව්‍යාපෘතියක් පනාගොඩ රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2023 මැයි 25 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන සංඥා නිලධාරි සහ ශ්‍රී ලංකා සංඥා බළකායේ බළකාධිපති මේජර් ජෙනරාල් කේඑඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු විසින් විවෘත කරන ලදී. බළකාධිපතිගේ සංකල්පයක් මත මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර, පාරිභෝගිකයින්ට ගුණාත්මක සහ සෞඛ්‍යාරක්ෂිතව තල කැරලි සාධාරන මිලට ලබාදීම මෙහි අරමුණක් වේ. මෙම අවස්ථාව සඳහා රෙජිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්/ නිලධාරීන් සහ සෙසු නිලයින් ද එක්ව සිටියහ.





## නවතමයෙන් ඉදිවන රෙජිමේන්තු මධ්‍යස්ථාන කෞතුකාගාරය

සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් කේඑඩබ්එස් රත්නායක එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ සංකල්පයක් මත දිර්ඝ කාලිනව රෙජිමේන්තු මධ්‍යස්ථානයට අඩුපාඩුවක්ව පැවති සංඥා බළකා සන්නිවේදන ඉතිහාසයේ විකාශනය පිළිබඳ තොරතුරු ගවේෂණය සඳහා කෞතුකාගාරයක් ස්ථාපිත කිරීමට කටයුතු සුදානම් කර ඇත. මේ සඳහා තෝරගත් ගොඩනැගිල්ල නවීකරණය කරමින් පවතින අතර කෞතුකාගාරය 2023 ඔක්තෝබර් 13 දින විවෘත කිරීමට නියමිතව ඇත.









## නවතමයෙන් ඉදිවන රෙජිමේන්තු මධ්‍යස්ථාන බළලත් නිලධාරී/සැරයන් නිවස්නය

මෙම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දැනට ඉදිකර ඇති බනි/සැරයන් නිවස්නයෙහි නේවාසික පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භ කර ඇත.





# සංඥා ක්ෂිතිජයෙන් ඔබ්බට

මේජර් ජෙනරාල් ඩීඑම්පීපී දසනායක ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් 2023 මාර්තු මස 10 වන දින දියතලාව යුධ හමුදා ජනපදයේ පිහිටි ඉදිරි නඩත්තු පෙදෙස (මධ්‍යම) මූලස්ථානයේදී 3 වන ආඥාපතිවරයා ලෙස සුබ මොහොතින් වැඩ භාර ගැනීම





බ්‍රිගේඩියර් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි යුද්ධ හමුදා මූලස්ථානයේ ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂකවරයා වශයෙන් 2022 ඔක්තෝබර් මස 05 වන දින සුභ මොහොතින් වැඩ භාර ගැනීම





බ්‍රිගේඩියර් ආර්එම්පීඑස්බී රත්නායක එන්ඩීසී ජ්‍යෙෂ්ඨ නිලධාරි යුද්ධ හමුදා තොරතුරු තාක්ෂණ විසඳුම් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂක වශයෙන් 2022 ඔක්තෝබර් මස 13 වන දින සුබ මොහොතින් වැඩ භාර ගැනීම



බ්‍රිගේඩියර් ජීඑල්එස්ඩබ්ලිව් ලියනගේ යුඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2023 අගෝස්තු මස 21 වන දින විදේශ මෙහෙයුම් අධ්‍යක්ෂක මණ්ඩලයේ අධ්‍යක්ෂකවරයා ලෙස සුබ මොහොතින් වැඩ භාර ගැනීම





බ්‍රිගේඩියර් ජීඑස් ෆොන්සේකා යුඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී ජාතික ශිෂ්‍යභට බළකායේ 14 වැනි අධ්‍යක්ෂකවරයා ලෙස 2023 ජනවාරි මස 12 වන දින සුබ මොහොතින් වැඩ භාර ගැනීම





බ්‍රිගේඩියර් කේඑම්පී බණ්ඩාරනායක යුඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2023 අප්‍රේල් මස 24 වන දින 561 පාබල බලසේනා මුලස්ථාන 9 වන බලසේනාධිපති වශයෙන් සුබ මොහොතින් වැඩ භාර ගැනීම






# උසස්වීම්

## මේජර් ජෙනරාල් නිලයට උසස්වීම



මේජර් ජෙනරාල්
ඩීඑම්පීපී දසනායක

## බ්‍රිගේඩියර් නිලයට උසස්වීම්



බ්‍රිගේඩියර්
පීසීවී ප්‍රනාන්දු



බ්‍රිගේඩියර්
කේඑම්පී බණ්ඩාරනායක යූඑස්පී පීඑස්සී



බ්‍රිගේඩියර්
එච්ඩීජේපී වීරතුංග



බ්‍රිගේඩියර්
ඒකේඩී අධිකාරි යූඑස්පී

## කර්නල් නිලයට උසස්වීම



කර්නල්
එම්කේපී පෙරේරා ආර්එස්පී යූඑස්පී



කර්නල්
එම්ආර් හමීම් යූඑස්පී



කර්නල්
එල්ඒ මෙන්ඩිස්



කර්නල්
ඒඑම්ටී අමරකෝන් පීඑස්සී

# පාඨමාලා

## විදේශීය පාඨමාලා (නිලධාරී)

### Multinational Communications Interoperability Program (MCIP-USA)



මේජර් ජෙනරාල්
කේඑඩබ්ලිව්එස් රත්නායක එන්ඩියු



බ්‍රිගේඩියර්
එච්ඩීජේපී වීරතුංග



බ්‍රිගේඩියර්
ඒකේඩී අධිකාරි යුඑස්පී

### Electronic Warfare and Information Security Course No 04 (Pakistan)



ලුතිනන් කර්නල්
ඩබ්ලිව්සීඑස් නානායක්කාර ශ්‍රීලංසංබ

### Junior Staff Course Linked with Mid - Career Course No 67 (Pakistan)



මේජර්
ටීඑම්එන්ඩී තෙන්නකෝන් පීඑස්සී ශ්‍රීලංසංබ

### Junior Staff Course Linked with Mid - Career Course No 68 (Pakistan)



මේජර්
එච්පීඑස් මුණසිංහ පීඑස්සී ශ්‍රීලංසංබ



මේජර්
එච්සී පාගොඩආරච්චි ශ්‍රීලංසංබ

### Signal Young Officers Course No 159 (India)



මේජර්
එස්ටීකේ දිසානායක ශ්‍රීලංසංබ



මේජර්
ඩීආර්පී හේවගේ ශ්‍රීලංසංබ



මේජර්
ජේඑඩීයුඑන් ජයසූරිය ශ්‍රීලංසංබ



කපිතන්
පීඑආර්එන් ධර්මරත්න ශ්‍රීලංසංබ

# දේශීය පාඨමාලා (නිලධාරී)

## National Security and Strategic Studies Course (Sri Lanka)





බ්‍රිගේඩියර් ආර්එම්පීඑස්බී රත්නායක එන්ඩීසී ජ්‍යෙෂ්ඨ නිලධාරී ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂක විද්‍යායතනයේ දී ප්‍රථම ජාතික ආරක්ෂාව සහ උපායමාර්ග අධ්‍යනය පාඨමාලාව සාර්ථකව හදාරා ඉන් උසස් අන්දමින් සමත් වී **"Strategic Intervention for National Food Security by Sri Lanka Army Through the Differentiate Approach"** මාතෘකාව යටතේ ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රය **(Research Paper)** සඳහා විද්‍යාපති උපාධිය හිමිකරගෙන ඇති අතර, එම පර්යේෂණ පත්‍රය පාඨමාලාවේ මුල් පර්යේෂණ පත්‍ර 05 අතරටත්, පාඨමාලාව හදාරන ලද ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අතුරින් පර්යේෂණ පත්‍ර 12 ක් තෝරාගත් අතර, මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී ඉදිරිපත් කරන ලද **"Strategic Option in the Face of Potential Challenges and Security Threat on Biden Administration by the Rising Power"** සහ **"Post-Independence Foreign Policy of Sri Lanka"** පර්යේෂණ පත්‍ර 2 ක ද තේරී ඇත.

තවද, 2020 වසරේ මුද්‍රණය කරන ලද පර්යේෂණ සඟරාව **(Research Journal)** සඳහා **"Security Challenge of United States and Policies of Biden Administration"** යන මැයෙන් ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකාව වෙනුවෙන් ජාතික ආරක්ෂක විද්‍යායතනයේ සේනාවිධායක විසින් ඉහත ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙත ප්‍රශංසනාත්මක ලිපියක් මඟින් සිය ප්‍රසාදය පලකර ඇත.

## Defence Services Command and Staff Course No 16



මේජර්
එස්එන්බීඑම්ජ්එස් බංඩාර පීඑස්සී ශ්‍රීලංසංබ



මේජර්
ටීඑස්ර් ප්‍රනාන්දු පීඑස්සී ශ්‍රීලංසංබ



මේජර්
ටීඑස්එන්කේ පීරිස් පීඑස්සී ශ්‍රීලංසංබ

# දෙස් විදෙස් පාඨමාලා හදාරන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්

### National Security and Strategic Studies Course (Sri Lanka)



බ්‍රිගේඩියර්
පීසීවී ප්‍රනාන්දු

### Higher Defence Management Course (India)



කර්නල්
බීඩී ප්‍රනාන්දු යූඑස්පී පීඑස්සී

### Senior Command Course (India)



කර්නල්
එස්ජේකේඩී ජයවර්ධන යූඑස්පී පීඑස්සී



කර්නල්
පීඩබ්ලිව්එම්එම්ඩී විජේරත්න ආර්එස්පී යූඑස්පී

# විදේශීය පාඨමාලා (සෙසුනිල)

මූලික පැරෂුට් පාඨමාලාව (ඉන්දියාව)



සංසෙ සුමනසේකර අයිඑච්
7 ශ්‍රීලංසංබ

කණිෂ්ඨ නායකත්ව පාඨමාලාව (ඉන්දියාව)



බන 1 පීඩීපී මධුරංග
2(සෙව්) ශ්‍රීලංසංබ

උසස් තොරතුරු තාක්ෂණ පාඨමාලාව (ඉන්දියාව)



කෝප්‍රල් සඳරුවන් ඩීඑච්කේ
6 ශ්‍රීලංසංබ

සරඹ උපදේශක පාඨමාලාව (ඉන්දියාව)



සැරයන් ඕවිටියාවත්ත එන්ඩී
2(සෙව්) ශ්‍රීලංසංබ

තොරතුරු තාක්ෂණ මෙහෙයුම් පාඨමාලාව (ඉන්දියාව)



බනි 1 එන්පී මාපලගම
11 ශ්‍රීලංසංබ

# දේශීය පාඨමාලා (සෙසුනිල)

ප්‍රථම ස්ථානය
මූලික සහතිකපත්‍ර පරිපාලන සහයක
පාඨමාලා අංක 121 (තිසාවැව)



සංසෙ තරුෂික එඑච්එල්ඩීඑන්
12 ශ්‍රීලංසංබ

මූලික පැරෂුට් පාඨමාලාව (කුඩාඔය)



කෝප්‍රල් වීරසිංහ ඩබ්ලිව්එම්කේපී
10 ශ්‍රීලංසංබ



ලා/කෝප්‍රල් පුෂ්පකුමාර
ආර්එම්එම් 2(සෙව්) ශ්‍රීලංසංබ



සංසෙ රන්කොත් ආර්ඩීඑස්යු
2(සෙව්) ශ්‍රීලංසංබ

# සාමසාධක රජකාරී වල නියුතු සංඥා බළකායට අයත් නිලධාරීන්

| අ:අ | රෙජි අංකය | නිලය | නම | ඒකකය | තනතුර | රට |
|---|---|---|---|---|---|---|
| 1 | නි/65020 | ලුති කර්නල් | ඒල්එන්පී ලියනගේ ශ්‍රීලංසංබ | 7 ශ්‍රීලංසංබ | සංඥා නිලධාරි | මාලි |
| 2 | නි/65115 | ලුති කර්නල් | එන්ඩබ්පීපීපී ඉන්ද්‍රජිත් යුඑස්පී ශ්‍රීලංසංබ | 3 ශ්‍රීලංසංබ | | ලෙබනන් |
| 3 | නි/65700 | මේජර් | එච්එම්පීඅයියුබී හේරත් යුඑස්පී පීඑස්සී | 3 ශ්‍රීලංසංබ | | මාලි |
| 4 | නි/68685 | මේජර් | එස්ආර්ආර් පීරිස් | 11 ශ්‍රීලංසංබ | තොතා නිලධාරි | මාලි |
| 5 | නි/68968 | මේජර් | ඩීඑස්ඒ දොලවත්ත | 6 ශ්‍රීලංසංබ | | ලෙබනන් |
| 6 | නි/70140 | මේජර් | සීඑස්කේ පතිරණ | 6 ශ්‍රීලංසංබ | | මාලි |

# සාමසාධක රජකාරී වල නියුතු සංඥා බළකායට අයත් සෙසුනිලයන්

| අ:අ | රෙජි අංකය | නිලය | නම | ඒකකය | රට |
|---|---|---|---|---|---|
| **1** | සෙ/279189 | බනි 11 | තරංග එම්ජීඑන් | 1 ශ්‍රීලංසංබ | දකුණු සුඩානය |
| **2** | සෙ/282868 | කෝප්‍රල් | කාංචන ජීඩී | 10 ශ්‍රීලංසංබ | |
| **3** | සෙ/279197 | බනි 11 | ගුණසිරි එස්ඩබ්ළුස් | 1 ශ්‍රීලංසංබ | ලෙබනන් |
| **4** | සෙ/279166 | බනි 11 | බංඩාර එච්එම්එන් | 5 ශ්‍රීලංසංබ | |
| **5** | සෙ/280116 | මා/සැ | දුමිත් කුමාර එච්බී | 10 ශ්‍රීලංසංබ | |
| **6** | සෙ/280132 | මා/සැ | හපුතන්ත්‍රී එච්එස්එස් | 10 ශ්‍රීලංසංබ | |
| **7** | සෙ/2සී00567 | මා/සැ | ගුණරත්න ඩීඑම් | 2 (සෙවි) ශ්‍රීලංසංබ | |
| **8** | සෙ/282340 | සැරයන් | රත්නායක ආර්එම්එන් | 3 ශ්‍රීලංසංබ | |
| **9** | සෙ/281967 | සැරයන් | රන්දෙනි ආර්පීඑකේ | 10 ශ්‍රීලංසංබ | |
| **10** | සෙ/280042 | සැරයන් | දිසානායක ඩීඑම්අයි | 7 ශ්‍රීලංසංබ | |
| **11** | සෙ/284143 | සැරයන් | තුෂාර අයිඑකේ | 11 ශ්‍රීලංසංබ | |
| **12** | සෙ/284757 | කෝප්‍රල් | පුලියද්ද එඑම්ජීඩබ්බී | 9 ශ්‍රීලංසංබ | |
| **13** | සෙ/284780 | කෝප්‍රල් | චතුරංග ඩබ්ඒටීඑම් | 5 ශ්‍රීලංසංබ | |
| **14** | සෙ/284775 | කෝප්‍රල් | ධර්මසේන ජීඑන්එස්කේ | 1 ශ්‍රීලංසංබ | |
| **15** | සෙ/284752 | කෝප්‍රල් | කලින්දු කේඑම්ඩී | 7 ශ්‍රීලංසංබ | |
| **16** | සෙ/284744 | කෝප්‍රල් | චතුරංග කේකේඑන් | 9 ශ්‍රීලංසංබ | |
| **17** | සෙ/284678 | කෝප්‍රල් | සිසිර කුමාර කේඩීඑම් | 10 ශ්‍රීලංසංබ | |
| **18** | සෙ/284617 | ලා/කෝප්‍රල් | සෙනෙවිරත්න ජේඑල්ඩීසී | 4 ශ්‍රීලංසංබ | |
| **19** | සෙ/286309 | ලා/කෝප්‍රල් | කරුණාරත්න ජේඑම්ඩබ්එල් | 7 ශ්‍රීලංසංබ | |
| **20** | සෙ/286449 | ලා/කෝප්‍රල් | රණසිංහ එස්එම්එම්ආර් | 7 ශ්‍රීලංසංබ | |
| **21** | සෙ/287119 | ලා/කෝප්‍රල් | උදයංග ජීඑන්එස් | 5 ශ්‍රීලංසංබ | |
| **22** | සෙ/284060 | මා/සැ | රත්නායක එම්ආර්ඩීටී | 11 ශ්‍රීලංසංබ | මාලී |
| **23** | සෙ/283544 | සැරයන් | පුෂ්ප කුමාර එම්ජීකේ | 1 ශ්‍රීලංසංබ | |
| **24** | සෙ/282767 | සැරයන් | ගුණරත්න එච්ජීඑ | 10 ශ්‍රීලංසංබ | |
| **25** | සෙ/282525 | සැරයන් | ප්‍රසන්න බීජීඑ | 5 ශ්‍රීලංසංබ | |
| **26** | සෙ/284402 | කෝප්‍රල් | කුමාර තිස්ස එස්එම් | 7 ශ්‍රීලංසංබ | |
| **27** | සෙ/284759 | කෝප්‍රල් | කුමාරතුංග ඩබ්ජීඑස්සී | 9 ශ්‍රීලංසංබ | |

# කෙළිබිම ජයගත්තෝ

## යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු රග්බි ශූරතාවලිය සමගින් ශ්‍රී ලංකා සංඥා බළකායේ රග්බි උරුමය යළි තහවුරුවෙයි

යුද්ධ හමුදා අන්තර රෙජිමේන්තු රග්බි ශූරතාවලිය යුද්ධ හමුදා ක්‍රීඩා දින දර්ශනයේ වඩාත් ආකර්ශනීය ඉසව්වක් වන අතර හට පිරිස් අතර, ක්‍රීඩාශීලිත්වය සහ සහෝදරත්වය සුවිශේෂී ලෙස විදහා දක්වයි. යුද්ධ හමුදා අන්තර රෙජිමේන්තු රග්බි ශූරතාවලිය - 2023 අගෝස්තු 04 (සිකුරාදා) සවස පනාගොඩ යුද්ධ හමුදා රග්බි ක්‍රීඩාංගනයේදී අතිවිශාල රග්බි ක්‍රීඩාලෝලීන්, නිලධාරීන්ගේ සහ සෙසුනිලයින් පිරිසක් මධ්‍යයේ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් විකුම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයු ගේ ප්‍රධානත්වයෙන් ආරම්භ විය.

දිරිගන්වනන්ගේ ප්‍රීති ඝෝෂා සහ ක්‍රිඩකයන්ගේ උද්වේගකර ක්‍රීඩා විලාශයන්ගෙන් පිරුණු මෙම තරගය ශ්‍රී ලංකා සංඥා බළකායේ **(SLSC)** සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බළකායේ **(SLAGSC)** පිරිමි අංශයේ අවසන් මහා තරගය විය. තරග අවසානයේ ක්‍රීඩකයින්ට ලකුණු 19 - 17ක් ලෙස ශ්‍රී ලංකා සංඥා බළකාය ශූරතාව හිමි කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා යද්ධ හමුදා සංඥා බළකාය ඉතිහාසය පුරා රග්බි ක්‍රීඩාව සදහා නම් දරා ඇති අතර, හිටපු අණදෙන නිලධාරි කර්නල් සීඑෆ් ප්‍රනාන්දුගේ රාජකාරී කාලසීමාවේදී 1965 - 1966 වසරවල රග්බි ක්‍රීඩාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට හඳුන්වාදීම සිදුවිය.

ශ්‍රී ලංකා සංඥා බළකාය 1968 දී අන්තර රෙජිමේන්තු රග්බි ශූරතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉතිහාසයේ ප්‍රථම වරට ලබා ගන්නා ලදී. තවද, ඔවුන් නැවතත් 1979 සිට 1988 දක්වා වසර නවයක් අපරාජිත ශූරයන් ලෙස රැඳී සිටින ලදී. ඉතිහාසය තුල, ශ්‍රී ලංකා සංඥා බළකායේ රග්බි කණ්ඩායම 1990, 1991 සහ 2015 වසරවල යුද්ධ හමුදා අනුශූරයන් බවට පත් විය. යුද්ධ හමුදා අන්තර රෙජිමේන්තු රග්බි ශූරතාවලියේ මෑත කාලීන ජයග්‍රහණයත් සමඟ 1988 වසරෙන් පසු වසර 35කට පසු ශ්‍රී ලංකා සංඥා බළකාය නැවතත් ශූරතා කුසලානය හිමිකර ගැනීමට සමත් විය.




ජයග්‍රාහී රග්බි ශූරතා කුසලානය යුද්ධ හමුදාධිපති අතින් හිමිකර ගැනීම



රග්බි කන්ඩායමට යුද්ධ හමුදාධිපතිවෙත හඳුන්වාදීම



අවසන් රග්බි තරගය අතර තුර ජයග්‍රාහී උණුසුම් මොහොතක්

# අන්තර් රෙජිමේන්තු යුද්ධ හමුදාධිපති රග්බි කුසලානය 2023
## ජයග්‍රාහී සංඥා බළකා කණ්ඩායම




## රග්බි තරගාවලිය නියෝජනය කල ක්‍රීඩකයන්



**SCRUMHALF** ස්ථානය
සැරයන්
කුමාරසිංහ වයිවීඩබ් (නායක)



**RESERVE** ස්ථානය
මා/සැරයන් ඉන්දික කුමාර ඊඩීඩී
(උපනායක)



**FULLBACK** ස්ථානය
මේජර්
ඊඑම්එන්ටී එදිරිසිංහ



**PROP** ස්ථානය
බනි 11
සම්පත් රෝසා එස්එස්



**SECOND ROW** ස්ථානය
සැරයන්
කොබ්බෑකඩුව කේඑස්එන්කේ



**WINGER** ස්ථානය
සැරයන්
ප්‍රේමජයන්ත ජේ



**FLANKER** ස්ථානය
සැරයන්
ප්‍රභාත් කුමාර ටිජිඑස්



**CENTER** ස්ථානය
සැරයන්
පෙරේරා එච්පීඑම්



**SECOND ROW** ස්ථානය
කෝප්‍රල්
පුෂ්පකුමාර කේඑස්



**WINGER** ස්ථානය
කෝප්‍රල්
මධුසංක ජේඑම්ජේ



**PROP** ස්ථානය
කෝප්‍රල්
පෙරේරා අයිජීසීපී



**FLYHALF** ස්ථානය
ලා/කෝප්‍රල්
බංඩාර ආර්ජීඩබ්එම්කේඩී



**HOOKER** ස්ථානය
ලා/කෝප්‍රල්
සිල්වා ඒජීඑච්ටී



**NO 8** ස්ථානය
ලා/කෝප්‍රල්
ජයවික්‍රම ඩීපීඑල්එල්



**CENTER** ස්ථානය
ලා/කෝප්‍රල්
සදරුවන් ඒඑස්එල්



**FLANKER** ස්ථානය
ලා/කෝප්‍රල්
විජේගුණවර්ධන පීකේවීඩී



**RESERVE (FR)** ස්ථානය
කෝප්‍රල්
පත්මකුමාර ඩබ්කේසීඒඩී



**RESERVE (FR)** ස්ථානය
ලා/කෝප්‍රල්
බංඩාර ජේඑම්ඒපී



**RESERVE (FR)** ස්ථානය
ලා/කෝප්‍රල්
වෛජයන්ත එම්පීටීඑස්



**RESERVE** ස්ථානය
බනි 11
කොස්තා පීආර්ඩබ්ලිව්



**RESERVE** ස්ථානය
ලා/කෝප්‍රල්
තල්වත්ත ටීඩීඑම්



**RESERVE** ස්ථානය
සංඥා සෙබළ
සුමනසේකර පීඑච්



**RESERVE** ස්ථානය
සංඥා සෙබළ
මධුසංක එන්පීඑස්







**TEAM MANAGER**
කපිතාන්
එම්ඩබ්පීඑන් මෙත්තානන්ද



**COACH**
ඒඑන් දසනායක මහතා



**ASSISTANT COACH**
බනි 11
කොඩිතුවක්කු කේඑම්පී



**MEDICAL PERSONNEL**
බන 11
තිසාර ඩීඒඩීඒඩීඩී



**MEDICAL PERSONNEL**
ලා/කෝප්‍රල්
රංග පීඑම්කේඑස්

# යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු හෑන්ඩ්බෝල් තෙවන ස්ථානය සමගින් ශ්‍රී ලංකා සංඥා බළකාය ප්‍රථම වරට හෑන්ඩ්බෝල් තරග ජය තහවුරුකරයි

2023 සැප්තැම්බර් 08 සිට 2023 සැප්තැම්බර් 10 දක්වා පනාගොඩ යුධ හමුදා ශාරීරික අභ්‍යාස පාසලේ පැවති යුධ හමුදා අන්තර් රෙජිමේන්තු හෑන්ඩ්බෝල් තරඟාවලියේ තෙවන ස්ථානය දිනා ගැනීමට ශ්‍රී ලංකා සංඥා බළකාය විසින් ප්‍රථම වරට ඉදිරිපත් කරන ලද කණ්ඩායම සමත්විය.






2023 යුධ හමුදා අන්තර් රෙජිමේන්තු හෑන්ඩ්බෝල් තරගාවලියේ තෙවන ස්ථානය දිනාගත් කණ්ඩායම



තෙවන ස්ථානයට හිමි කුසලානය හිමිකර ගැනීම



තරගය අතර තුර ජයග්‍රාහී උණුසුම් මොහොතක්

# ලෝක වාර්තාවක් පිහිටුවමින් සංඥා බළකායේ මාණ්ඩලික සැරයන් කේඅයිඑස් කීර්තිරත්න පේදුරුතුඩුවෙන් ඇරඹූ පාගමන දෙවුන්දර තුඩුවෙන් අවසන් කරයි









3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායට අයත් මාණ්ඩලික සැරයන් කීර්තිරත්න කේඅයිඑස් ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරී විසින් සතුරු ආක්‍රමණ හමුවේ තම ජීවිතය පුජා කල රණවිරුවන් හට උපහාර දැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ පේදුරුතුඩුවේ සිට දෙවුන්දරතුඩුව දක්වා වන කිලෝමීටර් 580 ක දුර ප්‍රමාණය දින 11 කින් පාගමනින් ගමන් කර ලෝක වාර්තාවක් පිහිටුවීමට සමත් විය. තත් ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොළත් නිලධාරී විසින් මෙම පාගමන 2023.09.05 වන දින 1800 පැයට පේදුරුතුඩුවෙන් ආරම්භ කරන ලද අතර, පාගමන අදියර 11 ක් යටතේ 2023.09.16 වන දින සම්පූර්න කිරීමට සමත් වන ලදී






ලා/කෝප්‍රල් බංඩාර කේජීඑජේ රුසියාවේ දී පැවැති පළමු ආරක්‍ෂක පිරිමි 7 වන රග්බි අභියෝගතා කුසලාන තරගාවලියට සහභාගීවී එම කණ්ඩායම තෙවන ස්ථානය දිනා ගන්නා ලදී



සංසෙ(කා) දුල්මිණි එච්පීඩීඑන් 2023 වර්ෂයේ පැවැති ජාතික කැරම් ශූරතා තරගාවලියේ දී කාන්තා කේවල ප්‍රථම ස්ථානය සහ ජාතික මහා කැරම් තරගාවලියේ කණ්ඩායම් තරග ඉසව්වේ ප්‍රථම ස්ථාන ලබාගෙන ඇත



සංසෙ විජේසිරි ඩබ්ලිව්එච්ජ්එස්එල් 2023 වර්ෂයේ පැවැති 22 වන ජාතික දුනු විදීමේ ශූරතාවලියේ දෙවන ස්ථානය සහ කණ්ඩායම් තරග ඉසව්වේ ප්‍රථම ස්ථාන ලබාගෙන ඇත



12 වන ජාතික ආරක්ෂක සේවා ජුඩෝ තරගාවලිය 2022 සහභාගීවූ සංසෙ(කා) හතුරුසිංහ එච්පීඑස්එල්එම් ක්‍රීඩිකාව විසින් කිලෝග්‍රෑම් 52 බර පන්තියේ ප්‍රථම ස්ථානය සහ කණ්ඩායම් තරගාවලියේ දෙවන ස්ථානය දිනා ගන්නා ලදී




සංසෙ සදරුවන් එච්පීආර් 5 ශ්‍රීලංසංබ

බංගලාදේශයේ ඩකානුවර පැවති 4 වන දකුණු ආසියානු **"Sepak Takraw"** තරගාවලිය සඳහා ශ්‍රී ලංකා ජාතික කන්ඩායම නියෝජනය කරමින් සහභාගී වන ලදී





අන්තර් රෙජිමේන්තු කරාතේ තරගාවලිය 2023 සදහා සහභාගීවූ ශ්‍රී ලංකා සංඥා බළකායේ සංසෙ(කා) මධුවන්ති වීඑච්එස්සී - කිලෝග්‍රෑම් 68 වැඩි බර පන්තියේ කුමිතේ සහ කාතා ප්‍රථම ස්ථානය, සංසෙ(කා) ලක්මාලි ඒඩීඑස් - කිලෝග්‍රෑම් 45 අඩු බර පන්තියේ කුමිතේ දෙවන ස්ථානය සහ කණ්ඩායම් ඉසව්වේ ප්‍රථම ස්ථානය, සංසෙ(කා) වැත්තෑව එස්එම්එන් කිලෝග්‍රෑම් 45 අඩු බර පන්තියේ කුමිතේ ප්‍රථම ස්ථානය සහ කණ්ඩායම් තරගාවලියේ ප්‍රථම ස්ථානය, සංසෙ(කා) ලොකුගමගේ එච්එල්එන්එස් - කිලෝග්‍රෑම් 55 අඩු බර පන්තියේ කුමිතේ ප්‍රථම ස්ථානය සහ කාතා කණ්ඩායම් ඉසව්වේ ප්‍රථම ස්ථානය, තවද, මෙම රෙජිමේන්තු කාන්තා කණ්ඩායම අන්තර් රෙජිමේන්තු කාන්තා තරගාවලියෙහි සම ශූරතාවය දිනා ගන්නා ලදී






